2022.09.08 මහා සභා වාර්තාව

පාණදුර නගර සභාව

දිනය	: 2022.09.08
වෙලාව	: පෙ.ව. 10.00
ස්ථානය	: නගර සභා රැස්වීම් ශාලාව

සහභාගී වීම:

ගරු සභාපති	- එම්.ඩී.නන්දන ගුණතිලක මහතා
ගරු උපසභාපති	- පී.එච්.විල්මන් මහතා
ගරු නාගරික මන්ත්‍රී	- රජීව සංජය වීරමන් මහතා
ගරු නාගරික මන්ත්‍රී	- අයි.ජානක උදයවර්ණ සොයිසා වික්‍රමසිංහ මහතා
ගරු නාගරික මන්ත්‍රී	- විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා
ගරු නාගරික මන්ත්‍රී	- එම්.පියසේන ප්‍රනාන්දු මහතා
ගරු නාගරික මන්ත්‍රී	- කේ.ඩී.අශෝකා රත්නමාලි මිය
ගරු නාගරික මන්ත්‍රී	_ ලලීන් හසන්ත රුදිගෝ මහතා
ගරු නාගරික මන්ත්‍රී	_ එච්.ඩී.මහින්ද පුන්සිරි මහතා
ගරු නාගරික මන්ත්‍රී	_ පුෂ්පා ෆොන්සේකා මිය
ගරු නාගරික මන්ත්‍රී	_ එච්.චන්දිම ඒ.පීරිස් මහතා
ගරු නාගරික මන්ත්‍රී	_ ගයා උදයංගනී ද සිල්වා මිය
ගරු නාගරික මන්ත්‍රී	_ එම්.පද්මසිරි සිල්වා මහතා
ගරු නාගරික මන්ත්‍රී	_ ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මහත්මිය
ලේකම්	_ ටී.මානෙල් සියඹලාගොඩ මෙය

සභාව පිළිගැනීම හා ආගම සිහි කිරීම

ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීමෙන් හා ආගම සිහිකිරීමෙන් පසුව මහා සභා රැස්වීමේ වැඩ කටයුතු පෙරවරු 10.00 ට ආරම්භ කරන ලදී.

(අ) පසුගිය සභාවේ රැස්වීම් වාර්තා සම්මත කිරීම -

(අ.1) 2022.08.04 මහා සභා වාර්තාව

(අ.1.1) ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා

(අ.1.1.1) පිටු අංක 02 හි ගරු නාගරික මන්ත්‍රී පද්මා කොස්තා මියගේ විදේශ නිවාඩු සඳහා වූ නිවාඩු අයදුම් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කළද එම යෝජනා කිරීම සඳහන්ව නැති බැවින් (ඇ.3) යන්න "ගරු නාගරික මන්ත්‍රී පද්මා සමරදිවාකර කොස්තා මිය ,2022.08.25 දින සිට 2022.11.25 දින දක්වා ඕස්ට්‍රේලියා රාජ්‍ය වෙත යෑමට විදේශ නිවාඩු අයදුම්කර ඇති බැවින් එම කාල සීමාව තුළ පවත්තන්නාවූ මහා සභා වාරයන් සඳහා හා කාරක සභා වාරයන් සඳහා නිවාඩු අනුමත කර දෙන මෙන් ගරු සභාපති නන්දන ගුණතිලක මහතා යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතාගේ ස්ථිරත්වයෙන් හා සියළුම සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් ඒකමතිකව 2022.08.25 දින සිට 2022.11.25 දින දක්වා කාලයට ගරු නාගරික මන්ත්‍රී පද්මා සමරදිවාකර කොස්තා මිය වෙත නිවාඩු අනුමත කරන ලදී"යනුවෙන් සංශෝධනය විය යුතු බව පවසා සිටින ලදී.

<u>සංශෝධන 01</u>

(ඇ.3)ගරු නාගරික මන්ත්‍රී පද්මා සමරදිවාකර කොස්තා මිය ,2022.08.25 දින සිට 2022.11.25 දින දක්වා ඕස්ට්‍රේලියා රාජ්‍ය වෙත යෑමට විදේශ නිවාඩු අයදුම්කර ඇති බැවින් එම කාල සීමාව තුළ පවත්තන්නාවූ මහා සභා වාරයන් සඳහා හා කාරක සභා වාරයන් සඳහා නිවාඩු අනුමත කර දෙන මෙන් ගරු සභාපති නන්දන ගුණතිලක මහතා යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතාගේ ස්ථිරත්වයෙන් හා සියළුම සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් ඒකමතිකව 2022.08.25 දින සිට 2022.11.25 දින දක්වා කාලයට ගරු නාගරික මන්ත්‍රී පද්මා සමරදිවාකර කොස්තා මිය වෙත නිවාඩු අනුමත කරන ලදී

2022.08.04 වන දින මහ සභා වාර්තාව,ඉහත සංශෝධන වලට යටත්ව පිළිගැනීම සුදුසු බව ගරු සභාපති එම්.ඩී.නන්දන ගුණතිලක මහතා විසින් යෝජනා කල අතර ,ගරු නාගරික මන්ත්‍රී එම්.පද්මසිරි සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදුව 2022.08.04 වන දින මහා සභා වාර්තාව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදන -

(ආ.1) බඳවා ගැනීම නවතා චක්‍රලේඛයක් නිකුත් කර ඇති මුත් බහුකාර්යය සංවර්ධන සහයකයින් මඟින් සපුරා ගත නොහැකි තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමට හැකියාවක් ඇත්ද යන්න ගරු බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කල අතර එහිදී එවන් තනතුරු සඳහා බඳවා ගැනීමට අවස්ථාව දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස දන්වා සිටි බැවින් වාර්තාවක් සකස් කර ගරු බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමා වෙත යොමුකිරීමට කටයුතු කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් සභාව වෙත නිවේදනය කරන ලදී.

(ආ.2) නාගරික සංවර්ධන අධිකාරියේ නිළධාරීන් සමඟ ආතර් වී දියෙස් උද්‍යානයේ පරිපාලනය සම්බන්ධයෙන් හා පොදු වෙළඳ පොළ ඉදිකිරීමේ කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වන ලදී.එහිදී ආතර් වී දියෙස් උද්‍යානය සභාව වෙත පවරා දෙන්නේ නම් එම ඉඩම ලබාගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් දරන ලද වියදමට සමාන මුදලක් සභාව විසින් ඔවුන් වෙත ලබාදීමට එකඟත්වයක් දක්වන්නේ නම් එම උද්‍යානය සභාව වෙත පවරා දිය හැකි බවට අදහසක් එලවූ අතර පොදු වෙළඳ සම්බන්ධයෙන් ගත්විට රටෙහි පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් මෙහි ඉදිකිරීම් කටයුතු කරගෙන යාම පිළිබඳවද ගැටළු මතු වී ඇති බවත් මෙම ඉදිකිරීම සඳහාද සභාව මඟින් ප්‍රතිපාදන ලබාදෙමින් යම් මැදිහත් වීමක් සිදුකළ හැකිද යන්න විමසා සිටි බවත් ගරු සභාපතිතුමා විසින් සභාව වෙත නිවේදනය කරන ලදී.

(ඇ) නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා -

(ඇ.1) ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා ,මෙදින මහා සභා වාරය වෙත නොපැමිණෙන බව දන්වා ඇති අතර මෙම සභික මහතාට නිවාඩු අනුමත කිරීමට ගරු සභාපති නන්දන ගුණතිලක මහතා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතාගේ ස්ථිරත්වයෙන් හා සියළුම සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් ඒකමතිකව නිවාඩු අනුමත කරන ලදී.

(ඇ.2) ගරු නාගරික මන්ත්‍රී කමල්සිරි ප්‍රනාන්දු මහතා ,මෙදින මහා සභා වාරය වෙත නොපැමිණෙන බව දන්වා ඇති අතර මෙම සභික මහතාට නිවාඩු අනුමත කිරීමට ගරු සභාපති නන්දන ගුණතිලක මහතා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.පද්මසිරි සිල්වා මහතාගේ ස්ථිරත්වයෙන් හා සියළුම සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් ඒකමතිකව නිවාඩු අනුමත කරන ලදී.

(ඈ) සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරීම -

(ඈ.1) ඉදිවෙමින් පවතින ගොඩනැගිල්ලට ජලය සහ විදුලිය ලබාගැනීම සඳහා වරිපනම් අංක ලබාගැනීමට යන මැයෙන් පාණදුර,නල්ලූරුව,මෝදරවිල පාර,අංක 1/22 හී පදිංචි කේ.පී.එල්.පෙරේරා යන අය විසින් ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා හරහා ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

(ඉ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා

(ඊ.1) ගරු සභාපති නන්දන ගුණතිලක මැතිතුමා, ඉදිරිපත් කරන ලද යෝජනා

(ඊ.1.1) 2023 වර්ෂයට වරිපනම් බදු පැනවීම

255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 166 වගන්තිය සමඟ කියවිය යුතු මහ නගර සභා ආඥා පනතේ 238(1) වගන්තිය යටතේ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පාණදුර නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාස වල, ගොඩනැගිලි වල, ඉඩම්වල, ගෙපත්වල, වාර්ෂික

වටිනාකම සඳහා 2022 වර්ෂය සඳහා වූ තක්සේරුව 2023 වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවත්,

එකී තක්සේරුව මත නගර සභා ආඥා පනතේ 160(1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමෙන්,නේවාසික දේපල හා ඉඩම් සඳහා සියයට පහක (5%) වාර්ෂික වරිපනම් බද්දක්ද,වෙළඳ හෝ වාණිජ්‍ය දේපළ සඳහා සියයට විස්සක(20%) වරිපනම් බද්දක්ද, මෝදරවිල කර්මාන්තපුරයේ දේපල මත සියයට විසි පහක (25%) වරිපනම් බද්දක්ද පනවා අය කල යුතු බවටත්,

තවද, 2023 වර්ෂයෙහි පහත උප ලේඛණයේ සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2023 වර්ෂයේ ජනවාරි 31 වැනි දින හෝ ඊට ප්‍රථම2023 වර්ෂයේ බද්ද ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, එකී උප ලේඛණයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාල වරිපනම් බදු මුදල පාණදුර නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් එක් කාර්තුවට අදාල මුදලින් සියයට පහක (5%) වට්ටමක්ද පාණදුර නගර සභාව ලබා දිය යුතු බවටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

<u>උපලේඛණය</u>

කාර්තුව	ගෙවිය යුතු දිනය	5% වට්ටම් සඳහා හිමිකම් ලබන අවසන් දිනය
පළමු කාර්තුව	2023.03.31	2023.01.31
දෙවන කාර්තුව	2023.06.30	2023.04.30
තුන්වන කාර්තුව	2023.09.30	2023.07.31
හතරවන කාර්තුව	2023.12.31	2023.10.31

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

ව්‍යාපාරිකයින් මෙන්ම රටේ සමස්ත ජනතාවම ආර්ථික වශයෙන් වැටී ඇති අවස්ථාවක 20%-25% ක බද්දයක් අයකිරීම සම්බන්ධයෙන් පක්ෂයේ ප්‍රතිපත්තියක් ලෙසත් පක්ෂයක් ලෙසත් ජනතා විමුක්ති පෙරමුණ මේ සඳහා විරුද්ධත්වයක් දක්වන බව පවසා සිටින ලදී.

2022.09.08 මහා සභා වාර්තාව

ගරු සභාපතිතුමා

මෙතෙක් මෙම සභාවේ පැවති බදු ව්‍යුහයම තමයි අදත් මෙම සභා වාරය සඳහා යෝජනා කර තිබෙන්නේ. සභාවක් වෙත ආදායම් ලැබෙන්නාවූ ප්‍රධාන මාර්ගය වරිපනම් බදු පැනවීමයි.එමෙන්ම මෙය නගර සභා ආඥා පනතේ අවශ්‍යතාවයක්.රටේ සමස්ථ කාර්යයන් කර ගෙන යාමට බදු ව්‍යුහයක් අත්‍යාවශ්‍යයි යැයි පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී ද සිල්වා මිය විසින් යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලා සිටින ලදින් යෝජනාවට පක්ෂව ඡන්ද 11 ක් ද විපක්ෂව ඡන්ද 03 ක්ද බැගින් ලැබුණු අතර වැඩි ඡන්ද 08 කින් යෝජනාව සභා සම්මත විය.

යෝජනාවට පක්ෂව ඡන්දය දුන් සභිකයින්:

01. ගරු සභාපති එම්.ඩී.නන්දන ගුණතිලක මහතා
02. ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා
03. ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා
04. ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා
05. ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා
06. ගරු නාගරික මන්ත්‍රී කේ.ඩී.අශෝකා රත්නමාලි මිය
07. ගරු නාගරික මන්ත්‍රී ලලීන් හසන්ත රුදිගෝ මහතා
08. ගරු නාගරික මන්ත්‍රී මහින්ද පුන්සිරි මහතා
09. ගරු නාගරික මන්ත්‍රී පුෂ්පා ෆොන්සේකා මිය
10. ගරු නාගරික මන්ත්‍රී එම්.පද්මසිරි සිල්වා මහතා
11. ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය

යෝජනාවට විපක්ෂව ඡන්දය දුන් සභිකයින්:

01. ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා
02. ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා
03. ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී ද සිල්වා මිය

සභාවේ නොසිටි සභිකයින්:

01. ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා
02. ගරු නාගරික මන්ත්‍රී කමල්සිරි ප්‍රනාන්දු මහතා
03. ගරු නාගරික මන්ත්‍රී පද්මා කොස්තා මිය
04. ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා

ඒ අනුව 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 166 වගන්තිය සමඟ කියවිය යුතු මහා නගර සභා ආඥා පනතේ 238(1) වගන්තිය යටතේ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පාණදුර නගර සභා බල ප්‍රදේශයඇතුළත පිහිටියා වූ නිවාස වල, ගොඩනැගිලි වල, ඉඩම්වල, ගෙපත්වල, වාර්ෂික වටිනාකම සඳහා 2022 වර්ෂය සඳහා වූ තක්සේරුව 2023 වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කිරීමටත්,එකී තක්සේරුව මත නගර සභා ආඥා පනතේ 160(1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමෙන්,නේවාසික දේපල හා ඉඩම් සඳහා සියයට පහක (5%) වාර්ෂික වරිපනම් බද්දක්ද,වෙළඳ හෝ වාණිජ්‍ය දේපළ සඳහා සියයට විස්සක(20%) වරිපනම් බද්දක්ද, මෝදරවිල කර්මාන්තපුරයේ දේපල මත සියයට විසි පහක (25%) වරිපනම් බද්දක්ද පනවා අය කිරීමටත්, තවද, 2023 වර්ෂයෙහි පහත උප ලේඛණයේ සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2023 වර්ෂයේ ජනවාරි 31 වැනි දින හෝ ඊට ප්‍රථම 2023 වර්ෂයේ බද්ද ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද, එකී උප ලේඛණයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාල වරිපනම් බදු මුදල පාණදුර නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් එක් කාර්තුවට අදාල මුදලින් සියයට පහක (5%) වට්ටමක්ද පාණදුර නගර සභාව ලබා දිය යුතු බවටත් තීරණය විය.

<u>උපලේඛණය</u>

කාර්තුව	ගෙවිය යුතු දිනය	5% වට්ටම් සඳහා හිමිකම් ලබන අවසන් දිනය
පළමු කාර්තුව	2023.03.31	2023.01.31
දෙවන කාර්තුව	2023.06.30	2023.04.30
තුන්වන කාර්තුව	2023.09.30	2023.07.31
හතරවන කාර්තුව	2023.12.31	2023.10.31

(ඊ.1.2) 2022 වර්ෂය සඳහා අයවැය මඟින් මුදල් ප්‍රතිපාදන වෙන්කළ මුත් මෙම වර්ෂයේ ඉදිරි මාසයන් සඳහා වියදම් දැරීමට මුදල් ප්‍රතිපාදන අවසන්ව ඇති වැය විෂයන් ඇතුලත්ව සකස් කල 01/2022 පරිපූරක ඇස්තමේන්තුව හා 02/2022 පරිපූරක ඇස්තමේන්තුව පිළිගැනීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

<u>**පරිපූරක ඇස්තමේන්තුව 01-2022**</u>

2022 වර්ෂයේ ඉඩම් විකිණීම මත අයකරන ලද 1% බදු මුදල වන රු 1000000.00 සඳහා වූ පරිපූරක ඇස්තමේන්තුව

මාරු අංකය	ඉල්ලීම් දිනය	අමතරව ලැබී ඇති මුදල	ඉල්ලුම් කරන මුදල	මුදල් අවශ්‍ය වැය විස්තරය	මුදල් අවශ්‍ය වැය ශීර්ෂය
පරිපූරක 01	2022.08.01	1,000,000.00	1,000,000.00	සවිකිරීම්,අලුත්වැඩියා හා නඩත්තු	124-1-1-1303

<u>පරිපූරක ඇස්තමේන්තුව 02-2022</u>

2019 වර්ෂයේ තුල බිල්කල මුද්දර ආදායම රු 14,814,435.00 කි.එහෙත් එම වර්ෂයට අදාළව 2022.05.24 දින වන විට රු 22,127,910.00 ක මුද්දර ගාස්තු ආදායමක් ලැබී ඇත.ඒ අනුව 2019 ලැබිය යුතු මුද්දර ගාස්තු ඉක්මවා අතිරේකව රු 7,313,475.00 ක මුදලක් ලැබී ඇත.එම රු 7,313,475.00 ක් සඳහා වූ පරිපූරක ඇස්තමේන්තුව

මාරු අංකය	ඉල්ලීම් දිනය	අමතරව ලැබී ඇති මුදල	ඉල්ලුම් කරන මුදල	වැය විස්තරය	මුදල් අවශ්‍ය වැය ශීර්ෂය
පරිපූරක 02	2022.08.01	7,313,475.00	2,300,000.00	ඉන්ධන	124-3-1-1208
	2022.08.01		500,000.00	ප්‍රවාහන ගාස්තු	124-1-1-1412(11)
	2022.08.01		2,000,000.00	ඉන්ධන	124-1-1-1208
	2022.08.01		2,500,000.00	බෝග වගා ව්‍යාපෘතිය	124-1-1-1249(11)
		එකතුව	7,300,000.00		

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා</u>

මෙම පරිපූරක ඇස්තමේන්තු 01 හා පරිපූරක ඇස්තමේන්තු 02 සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් සිදුකරන ලෙස ඉල්ලා සිටින ලදී.

පෙ.ව.10.50 - ගරු නාගරික මන්ත්‍රීජානක සොයිසා වික්‍රමසිංහ මහතාවිසින් ගරු සභාව , කාරක සභා අවස්ථාවට පත්විය යුතු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ලලීන් හසන්ත රුද්‍රිගෝ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව,කාරක සභා අවස්ථාවට පත්වන ලදී.

පෙ.ව. 11.10 - ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා විසින් කාරක සභාව ,ගරු සභා අවස්ථාවට පත්විය යුතු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රීජානක සොයිසා වික්‍රමසිංහමහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව,ගරු සභා අවස්ථාවට පත්වන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර2022 වර්ෂය සඳහා අයවැය මඟින් මුදල් ප්‍රතිපාදන වෙන්කළ මුත් මෙම වර්ෂයේ ඉදිරි මාසයන් සඳහා වියදම් දැරීමට මුදල් ප්‍රතිපාදන අවසන්ව ඇති වැය විෂයන් ඇතුලත්ව සකස් කල 01/2022 පරිපූරක ඇස්තමේන්තුව හා 02/2022 පරිපූරක ඇස්තමේන්තුව පිළිගැනීමට තීරණය විය.

<u>පරිපූරක ඇස්තමේන්තුව 01-2022</u>

2022 වර්ෂයේ ඉඩම් විකිණීම මත අයකරන ලද 1% බදු මුදල වන රු 1000000.00 සඳහා වූ පරිපූරක ඇස්තමේන්තුව

මාරු අංකය	ඉල්ලීම් දිනය	අමතරව ලැබී ඇති මුදල	ඉල්ලුම් කරන මුදල	මුදල් අවශ්‍ය වැය විස්තරය	මුදල් අවශ්‍ය වැය ශීර්ෂය
පරිපූරක 01	2022.08.01	1,000,000.00	1,000,000.00	සවිකිරීම්,අලුත්වැඩියා හා නඩත්තු	124-1-1-1303

<u>පරිපූරක ඇස්තමේන්තුව 02-2022</u>

2019 වර්ෂයේ තුල බිල්කල මුද්දර ආදායම රු 14,814,435.00 කි.එහෙත් එම වර්ෂයට අදාළව 2022.05.24 දින වන විට රු 22,127,910.00 ක මුද්දර ගාස්තු ආදායමක් ලැබී ඇත.ඒ අනුව 2019 ලැබිය යුතු මුද්දර ගාස්තු ඉක්මවා අතිරේකව රු 7,313,475.00 ක මුදලක් ලැබී ඇත.එම රු 7,313,475.00 ක් සඳහා වූ පරිපූරක ඇස්තමේන්තුව

මාරු අංකය	ඉල්ලීම් දිනය	අමතරව ලැබී ඇති මුදල	ඉල්ලුම් කරන මුදල	වැය විස්තරය	මුදල් අවශ්‍ය වැය ශීර්ෂය
පරිපූරක 02	2022.08.01	7,313,475.00	2,300,000.00	ඉන්ධන	124-3-1-1208
	2022.08.01		500,000.00	ප්‍රවාහන ගාස්තු	124-1-1-1412(11)
	2022.08.01		2,000,000.00	ඉන්ධන	124-1-1-1208
	2022.08.01		2,500,000.00	බෝග වගා ව්‍යාපෘතිය	124-1-1-1249(11)
		එකතුව	7,300,000.00		

(ඊ.1.3)මාර්කට් පාර පහත සඳහන් කඩවලට අදාලව පවතින හිඟ කඩ කුලී සම්පූර්නයෙන්ම ගෙවා අවසන් කරන ලෙස 2019.09.17 , 2019.10.16, 2020.07.23, 2020.08.12, 2022.02.17 හා 2022.04.27 දිනැති ලිපි මඟින් දැනුම් දී ඇතත් මෙතෙක් ගෙවා අවසන් කර නොමැති අතර කඩ කාමර දැනට මාස දෙකක පමණ කාලයක සිට වසා දමා ඇති බව ආදායම් පරීක්ෂක විසින්ද වාර්තා කර ඇත.එමනිසා එම කඩ කාමර නැවත සභාවට පවරා ගෙන මුද්‍රා තැබීමටත් හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් ඉදිරි වර්ෂයේදී ටෙන්ඩර් කිරීමටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

කඩ අංකය	නම	ලිපිනය	2022.07.31 දිනට හිඟ කඩ කුලී මුදල
L05	ඒ.ඒ.එම්.රිස්වාන්	නො.12/A,සම්සුදීන් මාවත,එළුවිල,පාණදුර	රු 494,500.00
L20	කළමනාකරු	විවධ සේවා සමූපකාර සමිතිය,පාණදුර	රු 719,197.14
L21	කළමනාකරු	විවධ සේවා සමූපකාර සමිතිය,පාණදුර	රු 719,197.14

යෝජනා ස්ථිරත්වය : ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

මෙම L05 කඩ කාමරය කුකුල් මස් වෙළඳාම සඳහා තමයි වෙන්කර තිබෙන්නේ.නමුදු කුකුල් මස් කඩ රාශියක් පවතින බැවින් එය කුකුල් මස් වෙළඳාම සඳහා ලබා ගැනීමට ජනතාව ඉදිරිපත් වීමක් සිදුවන්නේ නැහැ.එමනිසා ඉදිරියේදී යම් තීරණයක් ගෙන මෙම කඩ කාමරය වෙනත් වෙළඳාමක්ද කළ හැකි අයුරින් ටෙන්ඩර් කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතරමාර්කට් පාරL05, L20, L21 කඩ කාමර කඩ කුලී නිසි පරිදි ගෙවා නොමැති බැවින් එම කඩ කාමර නැවත සභාවට පවරා ගෙන මුද්‍රා තැබීමටත්,පහත වගුවේ සඳහන් හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් අදාළ කඩ කාමර ඉදිරි වර්ෂයට ටෙන්ඩර් කිරීමටත් තීරණය විය.

කඩ අංකය	නම	ලිපිනය	2022.07.31 දිනට හිඟ කඩ කුලී මුදල
L05	ඒ.ඒ.එම්.රිස්වාන්	නො.12/A,සම්සුදීන් මාවත,එළුවිල,පාණදුර	රු 494,500.00
L20	කළමනාකරු	විවධ සේවා සමූපකාර සමිතිය,පාණදුර	රු 719,197.14
L21	කළමනාකරු	විවධ සේවා සමූපකාර සමිතිය,පාණදුර	රු 719,197.14

(ඊ.1.4) පිහිණුම් තටාකයේ දැනට අයකරමින් පවතින ගාස්තු ,මුදල් හුවමාරු අපහසුතා නිසා පහත පරිදි සංශෝධනය කිරීමටත් , ගාස්තු අයකිරීමේදී වයස අවුරුදු 14 න් පහළ පිරිස්, ළමුන් වශයෙන් සැලකීමටත් අනෙකුත් අය වැඩිහිටියන් ලෙසත් සලකමින් ගාස්තු අයකිරීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

දැනට පවතින ගාස්තු(රු)	සංශෝධනය කිරීමට යෝජිත මුදල
රු 90.00 (ලමුන්ගෙන් එක් පැයක් සඳහා වූ ගාස්තුව)	රු100.00
රු 45.00 (ලමුන්ගෙන් පැය භාගයක් සඳහා වූ ගාස්තුව)	රු 50.00
රු 200.00 (වැඩිහිටියන්ගේ එක් පැයක් සඳහා වූ ගාස්තුව)	සංශෝධනය නොවේ

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතරපිහිණුම් තටාකයේ දැනට අයකරමින් පවතින ගාස්තු ,මුදල් හුවමාරු අපහසුතා නිසා පහත පරිදි සංශෝධනය කිරීමටත් , ගාස්තු අයකිරීමේදී වයස අවුරුදු 14 න් පහළ පිරිස්, ළමුන් වශයෙන් සැලකීමටත් අනෙකුත් අය වැඩිහිටියන් ලෙසත් සලකමින් ගාස්තු අයකිරීමටත් තීරණය විය.

දැනට පවතින ගාස්තු(රු)	සංශෝධිත මුදල
රු 90.00 (ලමුන්ගෙන් එක් පැයක් සඳහා වූ ගාස්තුව)	රු100.00
රු 45.00 (ලමුන්ගෙන් පැය භාගයක් සඳහා වූ ගාස්තුව)	රු 50.00
රු 200.00 (වැඩිහිටියන්ගේ එක් පැයක් සඳහා වූ ගාස්තුව)	සංශෝධනය නොවේ

(ඊ.1.5) සභාව සතු **JCB** රථය ,වෙනත් ආයතන විසින් ඔවුන්ගේ වැඩ කටයුතු සඳහා වෙන්කර ලබාදෙන ලෙස ඉල්ලීම් කරන අතර එහිදී පාණදුර නගර සභා සීමාව තුළ ඇති ස්ථානයක් වෙත ලබාදීමේදී මුල් මීටර් පැයකට රු 4500.00 ක්ද ඉන්පසු ගත වෙන සෑම පැය භාගයකටම රු 2250.00 බැගින් අයකිරීමටද මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතරසභාව සතු **JCB** රථය ,වෙනත් ආයතන විසින් ඔවුන්ගේ වැඩ කටයුතු සඳහා වෙන්කර ලබාදෙන ලෙස ඉල්ලීම් කරන අවස්ථාවන්හිදී ,පාණදුර නගර සභා සීමාව තුළ ඇති ස්ථානයක් වෙත ලබාදීමේදී මුල් මීටර් පැයකට රු 4500.00 ක්ද ඉන්පසු ගත වෙන සෑම පැය භාගයකටම රු 2250.00 බැගින් අයකිරීමටද තීරණය විය.

(ඊ.1.6) පැල තවාන ව්‍යාපෘතියට අනුව සකස් කරන ලද බණ්ඩක්කා,තක්කාලි ඇතුළු අනෙකුත් පැලවර්ග, පැල 02 ක් සහිත බඳුනක් රු 20.00 ක මුදලකට හා පැල 02 කට වැඩි ගණනක් සහිත බඳුනක් රු 25.00 ක මුදලකට මහජනතාව වෙත අලෙවි කිරීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු සභාපතිතුමා</u>

පැල තවාන ප්‍රධාන කාර්යාලයේ සිට හඩිසන් උද්‍යානයේ එක් පසෙකට රැගෙන යාමට නියමිතයි. ප්‍රධාන කාර්යාලයේ සිටි බහුකාර්යය සංවර්ධන සහකයින් කිහිපදෙනෙකු පිහිණුම් තටාකයට යොදවා ඇති බැවින් එම පැල තවානට අදාළ කාර්යයන් ඔවුන්ගේ සහයද හඩිසන් උද්‍යානයට අනුයුක්ත සභා සේවකයින්ගේ සහයද ඇතිව ඉදිරියට කරගන යාහැකි බව පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතරපැල තවාන ව්‍යාපෘතියට අනුව සකස් කරන ලද බණ්ඩක්කා,තක්කාලි ඇතුළු අනෙකුත් පැලවර්ග, පැල 02 ක් සහිත බඳුනක් රු 20.00 ක මුදලකට හා පැල 02 කට වැඩි ගණනක් සහිත බඳුනක් රු 25.00 ක මුදලකට මහජනතාව වෙත අලෙවි කිරීමට තීරණය විය.

පෙ.ව.11.30- ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා සභාව වෙත පැමිණෙන ලදී.

(ඊ.1.7) 2022වර්ෂයේ අයවැය යෝජනාවක් වන පාණදුර නගර සභා බලප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල අවුරුද්දක් වයසැති ළදරුවන් වෙනුවෙන් ලබාදෙන්නාවූ රු 3500.00 ක් වටිනා උපකරණ කට්ටලය සඳහා පහත භාණ්ඩ ලබාදීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

<u>**ලබාදීමට අපේක්ෂිත භාණ්ඩ ලැයිස්තුව**</u>

භාණ්ඩ වර්ගය	මිල(රු)
බේබි සබන් - (75g) කැට 05	1000.00
බේබි ඩයපර්ස් -4 ඇසුරුම පැකට් 01 ක්	600.00
බේබි ක්‍රීම් (200g) බෝතල් 01	500.00
සීරියල් පැකට් 01	750.00
බේබි කොලෝන් පැක්(බෝතල් 03 ක් සහිත)	650.00
එකතුව	**3500.00**

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු සභාපතිතුමා</u>

මෙහිදී අවුරුද්දක් වයසැති ළදරුවන් බවට සහතිකය පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිණියගෙන් ලබාගත හැකි අතර අඩුආදායම්ලාභී බවට සහතිකය අදාළ කොට්ඨාශයේ සභිකයා තහවුරු කිරීම පමණක් ප්‍රමාණවත් වන බවට අදහසක් පවතින අතර ඒ සඳහා යම් නෛතික බාධාවක් පවතිනවාද යන්න සොයාබලා හැකියාවක්

ඇත්නම් මීළඟ සභාවාරයට සභා යෝජනාවක් ඉදිරිපත් කර සභා තීරණයක් ගනිමින් එසේ කොට්ඨාශයේ සහිකයාගෙන් අඩුආදායම්ලාභී බවට සහතිකයක් ගැනීමට කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022 වර්ෂයේ අයවැය යෝජනාවක් වන පාණදුර නගර සභා බලප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල අවුරුද්දක් වයසැති ළදරුවන් වෙනුවෙන් ලබාදෙන්නාවූ රු 3500.00 ක් වටිනා උපකරණ කට්ටලය සඳහා පහත භාණ්ඩ ලබාදීමට තීරණය විය.

භාණ්ඩ වර්ගය	මිල(රු)
බේබි සබන් - (75g) කැට 05	1000.00
බේබි ඩයපර්ස් -4 ඇසුරුම පැකට් 01 ක්	600.00
බේබි ක්‍රීම් (200g) බෝතල් 01	500.00
සීරියල් පැකට් 01	750.00
බේබි කොලෝන් පැක්(බෝතල් 03 ක් සහිත)	650.00
එකතුව	**3500.00**

(ඊ.1.8) වර්තමානයේ රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් පාණදුර නගර සභාවට ලැබිය යුතු ආදායම්ද යම් තරමකට අහිමි වීමක් සිදුව ඇති බැවින්,හැකි උපරිම අන්දමින් වියදම් අවම කර ගැනීමට කටයුතු කළ යුතුව ඇත.ඒ අනුව,බස්නාහිර පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය මඟින් මේ වන විට සභාවේ පරිශ්‍රයන්හී ආරක්ෂක සේවය සඳහා යොදවා ඇති අතර එම සේවකයින් 09 දෙනාගෙන් පහත සඳහන් ස්ථානයන්හී දිවා/රාත්‍රී මුර සඳහා යොදවා ඇති සේවකයින් 04 දෙනෙකු අඩු කර,එම රාජකාරී ,සභා සේවකයින් මඟින් ආවරණය කර ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

1.ප්‍රධාන කාර්යාලය
2. මිනුවම්පිටිය සුසාන භූමිය } දිවා මුර සඳහා යොදවා ඇත
3. කසල අංගනය

4. පිහිනුම් තටාකය - රාත්‍රී මුර සඳහා යොදවා ඇත

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

මෑතකදී කුමුදු මන්ත්‍රීතුමාගේ බිරිඳගේ අවමංගල්‍ය සඳහා සහභාගීවූ අවස්ථාවේදී දුටුවා එදින මිනුවම්පිටිය සුසාන භූමියේ ආරක්ෂක සේවයේ යෙදීසිටි වෙස්ප්‍රෝ ආරක්ෂක සේවයේ නිළධාරියා ගරු උපසභාපතිතුමාගේ යතුරු පැදියට ඇතුළු වීමට ඉඩ දුන්නේ නැහැ.නමුත් ඊට පෙර වෙනත් වාහන කිහිපයකට ඇතුළු වීමට ඉඩ දුන්නා.එසේම මීට පෙරත් අවස්ථා කිහිපයකදීම ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂක සේවයේ යෙදීසිටි වෙස්ප්‍රෝ ආරක්ෂක සේවයේ නිළධාරියා රැදී නොසිටි අවස්ථා වාර්තා වී

තිබෙනවා.එමනිසා මෙම සේවකයින් 04 දෙනා පමණක් නොවේ මෙම ආරක්ෂක සේවයම නවතා සභා සේවකයින් මඟින් අදාළ මුරකටයුතු සිදුකර ගැනීම සුදුසු බව පවසා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

මෙම වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය නතර කිරීමට අදහසක් මාතුළද පැවතියද එය මේ අවස්ථාවේ සිදුකළ නොහැක්කේ සභාවේ පවතින සේවක හිඟය හා පවතින පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීම අත්හිටුවා ඇති බැවින්.එමනිසා දැනට මෙම සේවකයින් 04 දෙනා අඩුකිරීමට කටයුතු කරමු යැයි පවසා සිටින ලදී.තවද මෙම ආරක්ෂක සේවයේ පවතින්නා වූ ගැටළු සම්බන්ධයෙන් එම ආයතනයේ වගකිවයුතු නිළධාරීන් සමඟ සාකච්ඡාවක් සිදුකළ යුතු බව පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතරබස්නාහිර පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය මඟින් සභාවේ පරිශ්‍රයන්හී ආරක්ෂක සේවය සඳහා යොදවා ඇති සේවකයින් 09 දෙනාගෙන් පහත සඳහන් ස්ථානයන්හී දිවා/රාත්‍රී මුර සඳහා යොදවා ඇති සේවකයින් 04 දෙනෙකු අඩු කර,එම රාජකාරී ,සභා සේවකයින් මඟින් ආවරණය කර ගැනීමට තීරණය විය.

1.ප්‍රධාන කාර්යාලය
2. මිනුවම්පිටිය සුසාන භූමිය
3. කසල අංගනය

} දිවා මුර සඳහා යොදවා ඇති

4. පිහිනුම් තටාකය - රාත්‍රී මුර සඳහා යොදවා ඇති

(ඊ.1.9)2022.07.07 වන දින පැවති මහා සභාවේදී යෝජනා අංක ඊ.1.7 යටතේ නිවාස සඳහා ගලි සේවය සැපයීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු සංශෝධනය කරන ලදී.මෙයට සමගාමීව රාජ්‍ය ආයතන,ව්‍යාපාරික ස්ථාන හා ආගමික ස්ථාන සඳහා ගලි රථ සේවාව ලබාදීමේදී ගාස්තු සංශෝධනයක් පහත පරිදි සිදුවිය යුතුය.ඒ අනුව පහත පරිදි ගාස්තු සංශෝධනය කිරීමටත් නගර සභා සීමාවෙන් පිටත යාමට ඒමට ඇති 1km ක දුරක් සඳහා රු 200.00 ක මුදලක් අයකිරීමටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

<u>නගර සභා සීමාව තුළ</u>

කර්මාන්ත ශාලා හා ව්‍යාපාරික ස්ථාන සඳහා	= රු 10,000.00
ආගමික ස්ථාන සඳහා	= රු 7,500.00
රාජ්‍ය ආයතන සඳහා	= රු 8,000.00

<u>නගර සභා සීමාවෙන් පිටත</u>

කර්මාන්ත ශාලා හා ව්‍යාපාරික ස්ථාන සඳහා	= රු 12,000.00
ආගමික ස්ථාන සඳහා	= රු 9,500.00
රාජ්‍ය ආයතන සඳහා	= රු 10,000.00

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

අදහස් ප්‍රකාශ කරමින්:

ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා

ගිය සභා වාරයේදී මේ සම්බන්ධයෙන් සම්මත කරන ලද යෝජනාවටත් පක්ෂයක් වශයෙන් අපගේ විරුද්ධත්වය ප්‍රකාශ කර සිටියා.එම යෝජනාවේම කොටසක් වශයෙන් තමයි අද යෝජනාවත් ඉදිරිපත්වී තිබෙන්නේ.එමනිසා මේ සඳහාද අපගේ එකඟත්වය දක්වා සිටිය නොහැකි බැවින් මෙම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලා සිටින බව පවසා සිටින ලදී.

ගරු උපසභාපතිතුමා

යෝජනාවේ සඳහන් වෙනත් ස්ථාන සඳහා අයකිරීමට යෝජිත ගාස්තු සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති නමුදු ආගමික ස්ථාන සඳහා යෝජිත ගාස්තු යම් ප්‍රමාණයකින් අඩුකිරීම සුදුසු බව පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමා

මාතුළද එම අදහස පැවති අතර මේවන විට යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලා ඇති බැවින් මේ අවස්ථාවේ යෝජනා සංශෝධනයකට යොමු විය නොහැකියි.එමනිසා ආගමික ස්ථාන සඳහා මෙම යෝජනාවේ සඳහන් ගාස්තු ,යම් තරමකින් අඩුකරමින් මීළඟ මහා සභා වාරයට යෝජනාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමු යැයි පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා විසින් යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලා සිටින ලදින් යෝජනාවට පක්ෂව ඡන්ද 11 ක් ද විපක්ෂව ඡන්ද 03 ක්ද බැගින් ලැබුණු අතර වැඩි ඡන්ද 08 කින් යෝජනාව සභා සම්මත වූ අතර රාජ්‍ය ආයතන,ව්‍යාපාරික ස්ථාන හා ආගමික ස්ථාන සඳහා ගලි රථ සේවාව ලබාදීමේදී පහත පරිදි ගාස්තු සංශෝධනය කිරීමටත් නගර සභා සීමාවෙන් පිටත යාමට ඒමට ඇති 1km ක දුරක් සඳහා රු 200.00 ක මුදලක් අයකිරීමටත් තීරණය විය.

නගර සභා සීමාව තුළ

කර්මාන්ත ශාලා හා ව්‍යාපාරික ස්ථාන සඳහා	= රු 10,000.00
ආගමික ස්ථාන සඳහා	= රු 7,500.00
රාජ්‍ය ආයතන සඳහා	= රු 8,000.00

නගර සභා සීමාවෙන් පිටත

කර්මාන්ත ශාලා හා ව්‍යාපාරික ස්ථාන සඳහා	= රු 12,000.00
ආගමික ස්ථාන සඳහා	= රු 9,500.00
රාජ්‍ය ආයතන සඳහා	= රු 10,000.00

යෝජනාවට පක්ෂව ඡන්දය දුන් සභිකයින්:

01. ගරු සභාපති එම්.ඩී.නන්දන ගුණතිලක මහතා

02. ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා

03. ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

04. ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

05. ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා

06. ගරු නාගරික මන්ත්‍රී කේ.ඩී.අශෝකා රත්නමාලි මිය

07. ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා

08. ගරු නාගරික මන්ත්‍රී ලලීන් හසන්ත රුදිගෝ මහතා

09. ගරු නාගරික මන්ත්‍රී පුෂ්පා ෆොන්සේකා මිය

10. ගරු නාගරික මන්ත්‍රී එම්.පද්මසිරි සිල්වා මහතා

11. ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය

<u>යෝජනාවට විපක්ෂව ඡන්දය දුන් සභිකයින්:</u>

01. ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා

02. ගරුනාගරිකමන්ත්‍රීඑච්.වන්දිමඒ.පීරිස්මහතා

03. ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී ද සිල්වා මිය

<u>ඡන්දය දීමෙන් වැළකී සිටි සභිකයින්</u>

01. ගරු නාගරික මන්ත්‍රී මහින්ද පුන්සිරි මහතා

<u>සභාවේ නොසිටි සභිකයින්:</u>

01. ගරු නාගරික මන්ත්‍රී කමල්සිරි ප්‍රනාන්දු මහතා
02. ගරුනාගරික මන්ත්‍රී පද්මා කොස්තා මිය
03. ගරු නාගරික මන්ත්‍රී ආර්.බන්දුල සොයිසා මහතා

(ඊ.1.10)රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2022.01.26 සහ 2021.12.09 දිනැතිව එවා ඇති තක්සේරු වාර්තා වලින් පාණදුර නගර සභාව සතු එල් කඩ පහත පරිදි තක්සේරු කර ඇත.

අනු අංකය	කඩ කාමර අංකය	2022.01.26 දිනැති වාර්තාව අනුව නව තක්සේරු මුදල (රු)
01	L 01	13,750.00
02	L 02	16,500.00
03	L 05	19,250.00
04	L 06	19,250.00
05	L 07	16,500.00
06	L 08	16,500.00
07	L 09	16,500.00
08	L 10	16,500.00
09	L 11	19,250.00
10	L 12	22,500.00
11	L 13	40,250.00
12	L 14	40,250.00
13	L 15	40,250.00

14	L 16	40,250.00
15	L 17	23,250.00
16	L 18	50,000.00
17	L 19	12,500.00
18	L 20	26,500.00
19	L 21	26,500.00
20	L 22	20,500.00

අනු අංකය	කඩ කාමර අංකය	2021.12.09 දිනැති වාර්තාව අනුව නව තක්සේරු මුදල (රු)
21	L 03	19,500.00
22	L 04	19,500.00

ඒ අනුව ඉහත පරිදි එවා ඇති තක්සේරු වාර්තාව පිළිගැනීමටත්,නව තක්සේරු මුදල අයකිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව තීරණය කිරීමටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

මෙම යෝජනාවෙහි මෙම කඩ කාමර සඳහා පෙර වර්ෂයේ සලකා බැලූ තක්සේරු වටිනාකම් සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් වී නොමැති බැවින් එම තොරතුරු සමඟ ඉදිරි සභා වාරයට යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ගරු සභාපතිතුමා ,සභාවේ සියළු සභිකයින්ගේ එකඟත්වය මත යෝජනාව ඉවත් කරගන්නා ලදී.

(ඊ.1.11) නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 24/PM(WR)/93 හා 2022.08.10 වන දිනැති ලිපිය මඟින් රජය විසින් නිකුත් කරන ලද 2022.04.26 දිනැති චක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරව සහ රටෙහි පවතින වත්මන් අර්බුදකාරී තත්ත්වය මත පාණදුර පොදු වෙළඳපොල සංවර්ධන ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා ගැනීමට අපහසුතාවයක් පවතින බැවින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘතියෙහි දැනට කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් සිදුකළ ප්‍රමාණයට පමණක් ඉදිකිරීම් ඉදිරියට ගෙනයාමටත් ව්‍යාපෘතියෙහි ඉතිරි කොටස් නිම කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයාගැනීම සඳහා විකල්ප ක්‍රමවේදයන් ලෙස නගර සභා ප්‍රතිපාදන යටතේ හෝ/සහ වෙළඳ කටයුතු සඳහා පවතින කඩ කාමර පෙර විකුණුම් පදනම මත ලබාදී මුදල් ලබාගැනීම තුලින් මූල්‍ය අවශ්‍යතා ඉටු කර ගැනීමට පවතින ශක්‍යතාවය පිළිබඳව නගර සභාවේ එකඟත්වය විමසා ඇති අතර ඒ පිළිබඳව මෙම ගරු සභාවේ සාකච්ඡා කර තීරණ වලට එළඹිය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.නාගරික සංවර්ධන අධිකාරීයේ ලිපිය සභාගත කරන ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු සභාපතිතුමා</u>

මෙම ලිපියේ ව්‍යාපෘතියෙහි කොටසක් නිමකර තිබෙනවා යැයි සඳහන් කර තිබුණද සිදුකර ඇත්තේ ගොඩනැගිල්ල කඩා ඉවත්කිරීම පමණයි.මෙම ගොඩනැගිල්ල සෑදීම සම්බන්ධයෙන් ගත්විට යෝජනා 02 ක් නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉදිරිපත් කර තිබෙනවා.එනම් නගර සභා ප්‍රතිපාදන මඟින් ව්‍යාපෘතියෙහි ඉතිරි කොටස් සිදුකර ගැනීම හෝ වෙළඳ කටයුතු සඳහා පවතින කඩ කාමර පෙර විකුණුම් පදනම මත ලබාදී එම මුදල් ලබාගැනීම තුලින් ව්‍යාපෘතිය ඉටු කර ගැනීමයි.එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය එකඟ

වෙලා තියෙනවා පළමු මහල ස්ලැබ් එක දක්වා ඉදිකර දීමට.තවද ඔවුන් අපෙන් විමසා සිටිනවා,ස්ලැබ් එක දැමිය යුතුද වහලක් ගසා අවසන් කිරීමට එකඟද කියා.

<u>ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා</u>

මෙම ඉදිකිරීම සඳහා මෙම වසරේ නාගරික සංවර්ධන අධිකාරියෙන් ප්‍රතිපාදන වෙන්කර ගෙන ඇති අතර එම වෙන්කළ ප්‍රතිපාදන වලින් ගොඩනැගිල්ල කඩා දැමීම සඳහා වැයවන්න ඇත්තේ කොටසක් පමණක් වන බැවින් ඉතිරි කොටසින් පළමු මහළ පමණක් හෝ ස්ලැබ් දමා ඉදිකර දෙන ලෙස දන්වා යැවීම සුදුසු බව පවසා සිටින ලදී. එමෙන්ම ස්ලැබ් එක දමා නවතා දැමුව හොත් පෙර ගොඩනැගිල්ලසේම මෙයද දිරාපත් වීමට ලක්විය හැකි බැවින් ඊට උඩින් වහලක් ගැසිය යුතුයි.

<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

මේ සම්බන්ධයෙන් ගරු සභිකයින් සියල්ලන්ම එක්වී වෙනම සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු වන අතර ප්‍රතිපාදන යෙදවීම පිළිබඳව ගත්විට අදහස නම් දේශීය සංවර්ධන අරමුදලෙන් යම් මුදලක් කොටස් වශයෙන් ගෙවීමට ,සභාවෙන් ලබාගෙන එම මුදලින් ව්‍යාපෘති අවසන් කර ගැනීම සුදුසු බවයි. එමෙන්ම මේවන විට තාවකාලික කඩ කාමරවල සිටින්නාවූ වෙළඳුන් රාශියක් එම ස්ථානවල සිටීමට කැමැත්තක් දක්වනවා.

<u>ගරු සභාපතිතුමා</u>

මෙම ව්‍යාපෘතියෙහි සම්පූර්ණ වියදම ලෙස ගණන් බලා ඇත්තේ මිලියන 380 ක් පමණ.මෙම ගොඩනැගිල්ලේ යම් මට්ටමක් දක්වා මුදල් ලබාදීමට භාණ්ඩාගාරය එකඟතාවය ලබාදී තිබෙනවා.මෙහිදී මෙම ඉදිකිරීම සම්පූර්ණයෙන් සිදුකරන්න තමයි සභාවෙන් ප්‍රතිපාදන වෙන්කළ හැකිද යන්න විමසා සිටින්නේ.දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ණය මුදලක් ලබාගැනීමට හැකිවුවත් අප ලබාගන්නාවූ ණය මුදල අදාළ ඉදිකිරීමට ප්‍රමාණවත් වේදැයි කියා ගැටළුවක් පවතිනවා.ගරු උපසභාපතිතුමා පැවසූ කාරණයේ සත්‍යතාවයක් පවතිනවා.තාවකාලික කඩ කාමරවල සිටින වෙළඳුන් එම කඩ කාමර වලම වෙළඳාම් කිරීමට කැමැත්තක් දක්වනවා.ගැටළුවක්ව පවතින්නේ වසා දැමූ පාර විවෘත කිරීම සම්බන්ධයෙන් හා පදික වෙළඳුන්ට තැනක් ලබාදීම සම්බන්ධයෙන් පමණයි.

<u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

නාගරික සංවර්ධන අධිකාරියෙන් පවසා සිටින එක් ක්‍රමයක් තමයි කඩ කාමර පෙර විකුණුම් පදනම මත ලබාදී එම මුදල් ලබාගැනීම.නමුත් පෙර පැවති වෙළඳ පොළ ඉදිකිරීමේදී එසේ මුදල් ලබාගැනීම සම්බන්ධයෙන් වන චෝදනා අදටත් පවතිනවා.එමනිසා එම යෝජනාවට එකඟ නැහැ.දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ,ණයක් ලබාගෙන මෙය මෙම සභා වාරයේදී සාදා නිමකරන්න.තාවකාලික කඩ කාමරවල වෙළඳුන් එම ස්ථාන වලට කැමති නම් ඔවුන්ට ඒවායේම රැඳී සිටීමට ඉඩ දී නිමකරන පොදු වෙළඳපොළ සුපිරි වෙළඳසැල් වලට හෝ ටෙන්ඩර් කර වෙනත් වෙළඳුන්ට ලබාදීම හෝ සුදුසු බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා</u>

මෙම ගොඩනැගිල්ලේ සැලැස්ම සකස් කරන අවස්ථාවේදී මෙම සභාව පැත්තකින් තබා වැඩ කටයුතු කළා.එමනිසා මෙය ඉදිරියට කරගෙන යනවා නම් මේ සම්බන්ධයෙන් එක් එක් කොටස ඉටු කරන්නේ කවුද වගකීම කාටද යන්න බණ්ඩනයක් කරගත යුතු වෙනවා.නැතිනම් ඉදිරියේ සිදුවන සියළු දේට ජනතාවගෙන් සභාවට දොස් ලැබීමට හැකියි.එමනිසා සභිකයින් සාකච්ඡා කර තීරණයක් ගෙන ඒ අනුව ඉදිරි කටයුතු කරමු යැයි පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමා

දැක්වූ අදහස් අනුව මෙම කාරණය පළමුව සභිකයින් සියල්ල එකතු වී වෙනම සාකච්ඡා කර යම් තීරණයක් ගෙන පසුව නාගරික සංවර්ධන අධිකාරියේ නිළධාරීන්ද ගෙන්වා ගෙන ඔවුන් සමඟ සාකච්ඡා කිරීමටත් ඉන්පසු අවශ්‍යතාවය අනුව දේශීය ණය සංවර්ධන අරමුදලේ නිළධාරීන් සමඟ සාකච්ඡා කර අවසන් තීරණයක් ගැනීම සුදුසු බව පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතරපාණදුර පොදු වෙළඳපොල සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳව පළමුව සභිකයින් සියල්ල එක්වී සාකච්ඡා කිරීමටත් පසුව නාගරික සංවර්ධන අධිකාරියේ නිළධාරීන් සභාව වෙත කැඳවමින් පවතින්නාවූ තත්ත්වය පිළිබඳව සාකච්ඡා කිරීමටත් ඉන් අනතුරුව තීරණයක් වෙත එළඹීම සුදුසු බවත් තීරණය විය.

(ඊ.1.12) 2022 අගෝස්තුමස කමිටු වාර්තා අනුමැතිය සඳහා මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

(ඊ.1.12.1)2022.08.02 මහජන පෙත්සම් කාරක සභා නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී කේ.ඩී.අශෝකා රත්නමාලි මිය

ඒ අනුව අදාළ නිර්දේශ ඇතුළත් 2022.08.02 දිනැති මහජන පෙත්සම් කාරක සභා වාර්තාව පහත පරිදි වේ.

පාණදුර නගර සභාව

පෙත්සම් කාරක සභාව

දිනය - 2022.08.02
වේලාව - පෙ.ව 10.00
ස්ථානය - පාණදුර නගර සභාවේ කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
2	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත
3	ගරු නාගරික මන්ත්‍රී	පියසේන ප්‍රනාන්දු මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රීනී	අශෝකා රත්නමාලි මිය	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	කුමුදු ප්‍රනාන්දු මහතා	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුදිගෝ මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රීනී	පද්මා කොස්තා මිය	ඇත

8	ගරු නාගරික මන්ත්‍රී	එච්. චන්දිම ඒ. පීරිස් මහතා	ඇත
9	ගරු නාගරික මන්ත්‍රී	එම්.පද්මසිරි සිල්වා මහතා	නැත

<u>සහභාගී වූ නිලධාරීන්</u>

තනතුර	නම	පැමිණීම ඇත/නැත
වැඩ අධිකාරී	කේ.පී මායාරත්න මයා	නැත
මහජන සෞඛ්‍ය පරීක්ෂක	සම්පත් මොරමුදලි මයා	නැත
තාක්ෂණ නිළධාරී	එස්.ඩී.ආර් තුෂාරා මිය.	ඇත
තාක්ෂණ නිළධාරී	එම්.ජී.සී.පී විජේරත්න මිය.	ඇත
කළ.සේ.නිලධාරී	ඒස්.ඩී.වික්‍රමරත්න මිය.	ඇත
ප්‍රජා සංවර්ධන නිලධාරී වෙනුවට	ඉරෝමි කුරුප්පු ආරච්චි මිය	ඇත

<u>1.පෙත්සම</u> - තාප්පය හා නගර සභා මාර්ගය අවහිර වන ලෙස ගල්ගොඩ ගැසීම හා කුණු රැස්කර පුච්චා දැමීම නතර කර ගැනීම.- නො 12/34, මැදවේල්ල පාර දෙවන අතුරු පාර,

පැමිණිලිකරු - අජිත් ජයරත්න මයා,

වග උත්තරකරු - නිල්මිණි මිය,

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> -

වර්තමානයේ මාර්ගයට අනීතිකව සිදු කර ඇති බාධාවන් ඉවත් කර ඇති බවට වාර්තා වූ බැවින් පවතින අනතුරුදායක මායිම් තාප්පය කඩා ඉවත් කර නව මායිම් තාප්පයක් ඉදිකරන්නේ නම් මෙම සභාව මගින් තාප්පය සඳහා සංවර්ධන සැලසුමක් අනුමත කරවාගෙන ඉදිකරන ලෙසත් එසේ නොමැති නම් අනතුරුදායක තත්වය වලක්වාලන ලෙස තවදුරටත් මාර්ගයේ වෙනත් යම් බාධාවක් පවතී නම් මෙම සභාව දැනුවත් කරන ලෙසත් දෙපාර්ශවයට දන්වා යැවීමට තීරණය කරන ලදී.

කුණු පිලිස්සීම වැනි ක්‍රියා වර්තමානයේ පාරිසරික ගැටළුවලට හේතුවක් වී ඇති බැවින් හා එය පරිසර ආරක්ෂණ පනතට අනුව වරදක් වන බැවින් ද එසේ කිරීමෙන් වලකින ලෙසත් මාර්ගයට යම් බාධා පවතී නම් මෙම සභාව දැනුවත් කරන ලෙසත් ගැටළුකාරි වූ පැරණි මායිම් තාප්පය ප්‍රතිසංස්කරණය කළ යුතු බවට වග උත්තරකාර පාර්ශවය දැනුවත් කර ඇති බවත් පැමිණිලිකාර පාර්ශවයට දන්වා යැවීමටත් තීරණය කරන ලදී.

2.<u>පෙත්සම</u> - අනවසර ඉදිකිරීම - මායිම් ඇළ අවහිර වන සේ සිදුකර ඇති අනවසර ඉදිකිරීම ෆොන්සේකා පාර. -51/2 දරණ ස්ථානය.

පැමිණිලිකරු - වඩුගේ ධම්මික ප්‍රනාන්දු මයා

වග උත්තරකරු - රංජිත් ෆොන්සේකා මයා,

<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> -

වග උත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති 2022.06.14 දිනැති ලිපිය හා ඊට අදාලව පී.අජිත් පී ද සිල්වා මිනින්දෝරු තැනගේ 2022.06.08 දිනැති ලිපිය සලකා බලන ලද මහජන පෙත්සම් කාරක සභාව විසින් , දැනට උතුරු දිසාවේ පවතින ඇල මාර්ගය නිදහස් කර මායිම් සකස් කරගන්නා ලෙස වග උත්තරකාර පාර්ශවයට දන්වා යැවීමට තීරණය කරන ලදී.

3. <u>පෙත්සම</u> - අංක 53/15 දරණ ඉඩමට වැහිවතුර ගලා ඒම සම්බන්ධවයි (වැලිපිටිය, ශාසනවංශ මාවත , වැසි වතුර ගලා ඒම සම්බන්ධවයි.)

පැමිණිලිකරු - ඩබ්.ඒ.ඩී.ඔනිකා විජේසූරිය මිය
වග උත්තරකරු - රත්නසිරි ප්‍රනාන්දු මයා
<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> -

දෙපාර්ශවයම විසින් මිනින්දෝරු මහතකු ලවා මායිම් නිරවුල් කරගත යුතු බව මගේ සමාංක 2022.05.06 දිනැති ලිපිය මගින් දන්වා ඇත.

එම දැනුම්දීම නොසලකා හැරීම සහ දෙපාර්ශවයම කැරපන් ඇලෙහි බිම් කොටස් තම ඉඩමට ඒකාබද්ධ කරගෙන ඇති බවට මහජන පෙත්සම් කාරක සභාව විසින් නිරීක්ෂණය කර ඇති බැවින් එම ඇලෙහි මායිම් සලකුණු කර දන්වන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත දන්වා යැවීමට තීරණය විය.

4. හා 5. <u>පෙත්සම්</u> - කෙළින් වීදිය,අංක 242/4/A 1 ඉඩමට යාබද අනතුරුදායක පොල් ගස් සම්බන්ධවයි.

පැමිණිලිකරු - පී.එම්.සංජීව ප්‍රනාන්දු මයා.
පැමිණිලිකරු - ඩී.ලක්ෂ්මන් අප්පුහාමි මයා.
වග උත්තරකරු - අයිත්කරු,ජයන්ති ඇඹරුම්හල (පි.තමරි තෙනුජා මිය)
<u>කමිටුව විසින් ගන්නා ලද තීරණය</u> -

2022.08.02 දිනැති මහජන පෙත්සම් කාරක සභාවේදි වග උත්තරකාර පාර්ශවය කරුණු දක්වමින් පවසා සිටියේ මෙම අනතුරුදායක තත්වයට පත් වී ඇති නිවාසවල කොටස් රජයේ රක්ෂිත ඉඩමක අනවසරව ඉදිකර ඇති නිවාස බවය.

පැමිණිලිකාර පාර්ශවයන් දෙකම ඔවුන් විසින් භුක්ති විඳින බිම් කොටස් තුලද රජයේ රක්ෂිතයේ බිම් කොටස් පවතින බව ද ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට බදු ගෙවන බවද , වග උත්තරකාර පාර්ශවයට අදාල ඉඩමේ කොටසක් ද ගග රක්ෂිතයට අයත් බව ද ප්‍රකාශ කරන ලදි. නගර සභා ආඥා පනතට අනුව අනතුරුදායක ගස් හේතුවෙන් සිදුවිය හැකි ජීවිත හා දේපල හානි වලින් ආරක්ෂා කර ගැනීමට පනවා ඇති විධි විධාන ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව මහජන පෙත්සම් කාරක සභාව විසින්, පැමිණිළිකාර පාර්ශ්වයන්ට අනතුරුදායකව පවතින පොල් ගස් 04 කපා ඉවත් කරන ලෙස දන්වා යැවීමටත් එසේ නොවන්නේ නම් සභාව මගින් එම ගස් කපා ඉවත් කර එම මුදල වගඋත්තරකාර පාර්ශවයෙන් අයකර ගැනීමටත් කටයුතු කරන බව දන්වා යැවීමට තීරණය කරන ලදි,

තැනැත්තෙකුගේ හෝ දේපලක ආරක්ෂාවට තර්ජනයක් වන අනතුරුදායක ගස් සම්බන්ධයෙන්, නගර සභා ආඥා පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීමට බලතල නගර සභාවට පැවරී ඇති බව ද පානදුර ප්‍රාදේශීය ලේකම් ද දැනුවත් කිරීමට තීරණය විය.

06. පෙත්සම - සුමනධීර මාවත, අංක 13, නගර සභාවට අයත් ගොවිපලවත්ත ඉඩමේ මායිම් නිරවුල් කර ගැනීම.

පැමිණිලිකරු - සභාපතිතුමාගේ නියෝගය

වග උත්තරකරු - විල්සන් ප්‍රනාන්දු මයා, මාලනි පෙරේරා, ඒ. ජානක ප්‍රනාන්දු, එම්.මහේෂ් ප්‍රනාන්දු.

කමිටුව විසින් ගන්නා ලද තීරණය - සුමනධීර මාවත නගර සභා ඉඩමේ මායිම් නිරවුල් කර ගැනීම සඳහා එම ඉඩමට මායිම් වන බිම් කොටස් වල දැනට පදිංචිකරුවන් 2022.08.02 දින මහජන පෙත්සම් කාරක සභාවට කැඳවන ලදි. එහිදි ඔවුනගේ බිම් කොටස්වලට අදාල මිනින්දෝරු සැලසුම් හා හිමිකම් ඔප්පු පිටපත් ලබාගන්නා ලදි.

සුමනධීර මාවත වරිපනම් අංක 11 දරණ ඉඩමේ පදිංචිකරු වූ විල්සන් ප්‍රනාන්දු මහතා වෙනුවෙන් එල්. ඉන්දික ප්‍රනාන්දු මහතා සහභාගි වූ අතර එම ඉඩමට අදාල මිනින්දෝරු සැලසුම හා ඔප්පුවේ පිටපතක් (නඩුවක් පවතින බැවින්) සතියක් ඇතුලත ඉදිරිපත් කිරීමට පොරොන්දු විය.

සුමනධීර මාවත, වරිපනම් අංක 5/4 හා 5/5 දරණ ඉඩමේ පදිංචිකරු වූ මාලනි පෙරේරා මිය සහභාගි වූ අතර එම ඉඩමට අදාල මිනින්දෝරු සැලසුම් අංක 8185 පිටපත හා අංක 13196 , 3319 ඔප්පු පිටපත් ඔවුන් විසින් ඉදිරිපත් කරන ලදි.

ෆොන්සේකා පාර ,වරිපනම් අංක 54/1 හි දරණ ඉඩමේ පදිංචිකරු වූ ඒ.ජානක ප්‍රනාන්දු මහතා සහභාගි වූ අතර එම ඉඩමට අදාල මිනින්දෝරු සැලසුම් අංක 5707, 741 පිටපත් හා අංක 10237 දරණ ඔප්පු පිටපත ඔවුන් විසින් ඉදිරිපත් කරන ලදි.

ෆොන්සේකා පාර ,වරිපනම් අංක 74/8 හි දරණ ඉඩමේ පදිංචිකරු වූ එම්.මහේෂ් ක්‍රිෂාන්ත මහතා සහභාගි වූ අතර එම ඉඩමට අදාල මිනින්දෝරු සැලසුම් අංක 8729 හි පිටපත හා අංක 493 දරණ ඔප්පු පිටපත ඔවුන් විසින් ඉදිරිපත් කරන ලදි.

ඒ අනුව සුමනධීර මාවත වරිපනම් අංක 11 දරණ ඉඩමට අදාල මිනින්දෝරු සැලසුම හා ඔප්පුවේ පිටපතක් න්වා ගැනීමට එම වර්තමාන පදිංචිකරු වන එල්. ඉන්දික ප්‍රනාන්දු මයාට දන්වා යැවීමට තීරණය කරන ලදි.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.08.02 මහජන පෙත්සම් කාරක සභා නිර්දේශ,අනුමත කිරීමට තීරණය විය.

(ඊ.1.12.2) 2022.08.12 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී කේ.ඩී.අශෝකා රත්නමාලි මිය

ඒ අනුව අදාළ නිර්දේශ ඇතුළත් 2022.08.12 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු වාර්තාව පහත පරිදි වේ.

පාණදුර නගර සභාව

සෞඛ්‍ය,පරිසර හා ආපදා කළමනාකරණ කමිටු වාර්තාව

දිනය : - 2022.08.12
වේලාව : - පෙ.ව. 10.00
ස්ථානය : - පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයින්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
2	ගරු උපසභාපති	පී.එච්.විල්මන් මහතා	ඇත
3	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	කේ.ඩී.අශෝකා රත්නමාලි මිය	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	එම්. කුමුදු ප්‍රනාන්දු මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රී	පුෂ්පා ෆොන්සේකා මිය	නැත
8	ගරු නාගරික මන්ත්‍රී	එච්.වන්දිම ඒ.පීරිස් මහතා	නැත
9	ගරු නාගරික මන්ත්‍රී	ගයා උදයංගනී ද සිල්වා මිය	නැත

සහභාගී වූ වෙනත් නිළධාරීන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
2	මහජන සෞඛ්‍ය පරීක්ෂක	සම්පත් මොරමුදලි මහතා	ඇත
3	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
4	අංශ ප්‍රධානී(සෞඛ්‍ය)	එච්.ටී.හෙට්ටිආරච්චි මිය	ඇත
5	කළමනාකරණ සේවා නිළධාරී	යූ.එන්.ජයසිංහ මහතා	ඇත
6	ප්‍රජා සංවර්ධන නිළධාරී වෙනුවට	එම්.ජී.ඉරේෂන් පෙරේරා මහතා	ඇත
7	සෞඛ්‍ය පරිපාලක	දිල්හාර නන්දනතිලක මහතා	ඇත
8	සෞඛ්‍ය පරිපාලක	ආර්.ආර්.ඒ. වික්‍රමසිංහ මහතා	ඇත
9	සුසානභූමි භාරකරු	අජන්ත සෙත්සිරි මහතා	ඇත

ගරු නාගරික මන්ත්‍රී පුෂ්පා ෆොන්සේකා මිය හා ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී ද සිල්වා මිය අද දින හදිසි හේතුන් මත කමිටුව වෙත සහභාගී විය නොහැකි බව දුරකථනයෙන් දැනුම් දුන් බව ලේකම්තුමිය විසින් කමිටුව වෙත පවසා සිටි අතර ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී පුෂ්පා ෆොන්සේකා මිය හා ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී ද සිල්වා මිය වෙත කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟතාවය මත නිවාඩු අනුමත කරන ලදී.

01. නගර සභා කසල රැගෙන යන ට්‍රැක්ටර් රථහී ඉන්ධන ටැංකි වල ආරක්ෂකව සඳහා එම ටැංකි අගුළු දමා සකස් කර ගැනීමට සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

අගුළු දැමීම වෙනුවට වැඩ අධිකාරීතුමා විසින් කමිටුව වෙත දැක්වූ අදහස් පරිදි ඉන්ධන ටැංකිය වෙත ඉන්ධන ඇතුල් කරන නලය තුලට නලයේ කෙළවරට දැලක් සවිකළ තවත් නලයක් ඇතුළත් කර සකස් කිරීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

02. පිහිණුම් තටාකයට නව තාක්ෂණයෙන් යුක්ත ජල තටාක පරීක්ෂණ කට්ටල දෙකක් මිලදී ගැනීම සඳහා සෞඛ්‍ය කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

නව තාක්ෂණයෙන් යුක්ත ජල තටාක පරීක්ෂණ කට්ටල දෙකක් මිලදී ගැනීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

03. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

3.1 නගර මධ්‍යයේ ඇති සභාවට අයත් නොවූවද ජනතාව වැඩිපුර ගැවසෙන්නාවූ පුද්ගලික බස් නැවතුම් පොළ පරිශ්‍රය හා ආතර් වී දියෙස් උද්‍යානය යන ප්‍රධාන ස්ථාන දෙකද නගර සභාව විසින් නඩත්තු කළයුතු ස්ථානයන් වන හඩිසන් උද්‍යානය හා උසාවිය ආසන්න භූමි ප්‍රදේශයද දෛනිකව පිරිසිදු කරමින් නිසි පිරිසිදුතාවයකින් පවත්වාගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟත්වය මත නිර්දේශ කරන ලදී.

3.2 ගාලු පාර මධ්‍යය තීරුවේද පොලිතින් රැදී ඉතා අශෝභන අන්දමින් පවතින බැවින් එම තීරුවද පිරිසිදු කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟත්වය මත නිර්දේශ කරන ලදී.

3.3 කසල අංගන ගොඩනැගිල්ලේ ඉහළ මහල වසා දමා යතුර සභාව වෙත භාරදීමට කටයුතු කළ යුතු අතර එම කාමරයේ තිබූ විදුලි පංකාවක් සහා සේවකයෙකු විසින් රැගෙන ගොස් නැවත භාර දී තිබෙන නමුදු මෙසේ සභාවේ වත්කම් කිසිදු සේවකයෙකු හට රැගෙන යා නොහැකි බැවින් ඒ පිළිබඳව විධිමත් විමර්ෂණයක් සිදුකළ යුතු බව ගරු සභාපතිතුමා විසින් පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟත්වය මත නිර්දේශ කරන ලදී.

3.4 රාජකාරී අවසන් කර ඇඟිලි සලකුණු තබා සභා පරිශ්‍රයන් තුළින් පිටත්වූ පසු නැවත සභා පරිශ්‍රයක් වෙත ඇතුළත් විය නොහැකි අතර කිසිදු වාහනයක් සභා පරිශ්‍රයන් තුළට ඇතුළත් කිරීමෙන් වළකින ලෙස සියළුම සේවකයින් හා නිළධාරීන් දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟත්වය මත නිර්දේශ කරන ලදී.

3.5 දුම්රියපළ අසළ රථගාලේ ගේට්ටුව කැඩී මේවන විට එය කසල අංගනය වෙත දමා ඇති අතර මෙය කඩිනමින් අළුත්වැඩියා කර සවිකළ යුතු බව ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.එහි සවිකර තිබූ ආකාරයේ ගේට්ටුවක් ,නඩත්තු අංශයේ ඇති බැවින් එය රථගාල වෙත සවිකිරීමත් ඒ අතරතුර මේවන විට ගලවා ඉවත්කර ඇති ගේට්ටුව අළුත්වැඩියා කිරීමට කටයුතු කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟත්වය මත නිර්දේශ කරන ලදී.

3.6 සම්පත් බැංකුව ඉදිරිපස අනවසර ලෙස වාහනයක් ගාල් කර තබමින් කෑම විකිණීමට කටයුතු කරන අතර එම වාහනය මඟින් මාර්ගය අවහිර වීමක් සිදුවන බවත් එය ඉවත් කිරීමට කටයුතු කළ යුතු බවත් ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා විසින් පවසා සිටින ලදී.ආදායම් පරීක්ෂක නිළධාරීන් මඟින් පරීක්ෂා කර එය ඉවත් කිරීමට කටයුතු කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

3.7 කසල අංගනයේ ඇති ගොඩනැගිල්ලේ පහළ ඇති කාමරය තුළ දිනක් සභාවේ සේවක මහතෙකුගේ පුතෙක් යැයි පවසමින් පුද්ගලයෙක් අනවසරයෙන් ඇතුළු වී පලා වෙළඳාමේ යෙදීමට කටයුතු කරමින් සිටි අතර තමා විසින් එම ස්ථානයෙන් ඔහුව ඉවත් කළද මේවන විට එම පුද්ගලයා විසින් අදාළ කාමරය ඉදිරිපිට වෙළඳාම් කටයුතු සිදුකරන බව ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා විසින් පවසා සිටින ලදී.මෙවන් දේ සිදු නොවීමට ආරක්ෂ නිළධාරීන් වගබලාගත යුතු අතර ඔවුන්ගේ කාර්යය නිසිපරිදි ඉටු නොවීමක් සිදුවන බව පෙනීයන බැවින් වෙස්ප්‍රෝ ආරක්ෂ නිළධාරීන් සමඟ සාකච්ඡාවක් යොදා ගනිමින් ඔවුන්ව දැනුවත් කිරීමට කටයුතු කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟත්වය මත නිර්දේශ කරන ලදී.

3.8 රේල් ගේට්ටුව ආසන්නයේ ඇති මාර්ගයේ ඇති කාණුව මේවන විට ගස්වැවී අවහිර වී ඇති බව ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා විසින් පවසා සිටි අතර නගරයේ ඇති සියළු කාණු ,නිසි කාණු සැලැස්මක් සකස් කරමින් සෞඛ්‍ය අංශයේ හා කර්මාන්ත අංශයේ සේවකයින් යන කණ්ඩායම් දෙකම යොදවා ගනිමින් පිරිසිදු කිරීමට කටයුතු කළ යුතු බව ගරු සභාපතිතුමා විසින් පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟත්වය මත නිර්දේශ කරන ලදී.

3.9 තාවකාලික කඩ කාමරවල භාවිතය සඳහා සවිකර ඇති ජලකරාම වලින් රාත්‍රී කාලයේදී ජලය වෙනත් පුද්ගලයින් විසින් අනිසි ලෙස භාවිතා කරන බව ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා විසින් පවසා සිටි අතර එම ජල කරාම 04 සඳහා ගේට්වෑල් දමා ජල සැපයුම රාත්‍රී කාලයේදී අවහිර කර තැබීමට කටයුතු කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

3.10 පාණදුර,මහජන බැංකු පරිශ්‍රයේ ඇති අඹ ගසක අතු කපා ඒ අසළ ප්‍රධාන මාර්ගයට දමා ඇති බව ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා විසින් පවසා සිටින ලද අතර අදාළ කළමනාකරු වෙත එම අතු ඉවත් කර ගන්නා ලෙස දැනුවත් කරන ලෙසත් ඔවුන්හට ඉවත් කළ නොහැකි නම් සභාව වෙත ගාස්තු ගෙවා සභාව වෙතින් එම අතු ඉවත් කර ගන්නා ලෙස දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

3.11 පාණදුර වෙරළ තීරයේ ළමා උද්‍යානයේ ඇති සෙල්ලම් උපකරණ කැඩී බිඳී ඇති අතර දරුවන් ඒ තුළට ඇතුළු වීමෙන් අනතුරුවලට භාජනය විය හැකි බැවින් එම උපකරණ ගලවා ඉවත් කිරීම හෝ අනතුරුදායක බැවින් "ඇතුල් වීමෙන් වළකින" ලෙස පුවරු සවිකිරීම කළ යුතු බව ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා විසින් පවසා සිටින ලදී.එම උපකරණ ගලවා ඉවත් කරන ලෙසත් එතෙක් "අනතුරුදායක බැවින් ඇතුළු වීමෙන් වළකින " ලෙස සඳහන් කරමින් පුවරු සවිකර ඇතුළු වීමට නොහැකි ලෙස වටකිරීමට කටයුතු කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

3.12 ප්‍රධාන කාර්යාලයේ පිටුපස තාප්පය උසින් අඩු බැවින් ආරක්ෂාව පිළිබඳ සලකා බලමින් එම තාප්පයට උඩින් දැලක් ගැසීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා කමිටුව වෙත පවසා සිටි අතර ඒ අනුව ප්‍රධාන කාර්යාලයේ පිටුපස තාප්පය උඩින් දැල් වැටක් ගැසීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සහික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.08.12 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටු නිර්දේශ,අනුමත කිරීමට තීරණය විය.

(ඊ.1.12.3) 2022.08.12 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය

ඒ අනුව අදාළ නිර්දේශ ඇතුළත් 2022.08.12 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව පහත පරිදි වේ.

<u>පාණදුර නගර සභාව</u>

<u>කර්මාන්ත හා නගර සභා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව</u>

දිනය : - 2022.08.12

වේලාව : - ප.ව. 12.30

ස්ථානය : - පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයින්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
2	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	නැත
3	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	එම්. පියසේන ප්‍රනාන්දු මහතා	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුද්‍රිගෝ මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රී	මහින්ද පුන්සිරි මහතා	නැත
8	ගරු නාගරික මන්ත්‍රී	ආර්. බන්දුල සොයිසා මහතා	ඇත
9	ගරු නාගරික මන්ත්‍රී	ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය	ඇත

සහභාගී වූ වෙනත් නිළධාරීන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
2	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
3	තාක්ෂණ නිළධාරී	එස්.ඩී.ආර්. තුෂාරා මිය	ඇත
4	තාක්ෂණ නිළධාරී	ප්‍රසාදි විජේරත්න මිය	ඇත
5	තාක්ෂණ නිළධාරී	ජයන්ත ඇල්පිටිය මහතා	ඇත
6	අංශ ප්‍රධානී (කර්මාන්ත)	තමිලා විජයසිංහ මිය	ඇත
7	සංවර්ධන නිළධාරී(නීති)	ඉමල්කා වේරගම මිය	ඇත
8	කර්මාන්ත පරිපාලක	නිමල් අල්විස් මහතා	ඇත
9	ක්‍රීඩාභූමි භාරකරු	නාමල් ජයවර්ධන මහතා	ඇත
10	වැඩ අධීක්ෂක	ජේ.අමිත් ඩිල්ෂාන් මහතා	ඇත
11	වැඩ අධීක්ෂක	චරිත් ප්‍රසාද් වික්‍රමසූරිය මහතා	ඇත
12	වැඩ අධීක්ෂක	චමිල ලසන්ත මහතා	ඇත

01. PUC/05/03/01-02/2020 ලිපිගොනුවට අනුව LL-7533 අංක දරණ කෘ කැබ් රථය,Panadura Auto Service ආයතනය මගින් සේවා කිරීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 19,520.00 ක මුදල ගෙවීමට කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 19,520.00 ක මුදල Panadura Auto Service ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

02. PUC/5/4/3/35/2020 ප්‍රධාන පුස්තකාලයේ වැසිකිළිය සකස් කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකසන ලද රු 3,339,908.37 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

මෙහි සම්පූර්ණ අළුත්වැඩියාවක් වෙත යොමු නොවී පිරිමි වැසිකිළි පද්ධතියේ බිත්තියේ ටයිල් නැවත ඇල්ලීම, වැසිකිළි පද්ධති හා නල පද්ධතිය අළුත්වැඩියා කිරීම කාන්තා හා පිරිමි වැසිකිළියන්හී දොරවල් සකස් කිරීම හා ගලි වල සකස් කිරීම යන අළුත්වැඩියාවන් සඳහා පමණක් ඇස්තමේන්තු සකස් කිරීමට සාල්තබන ලදී.

03. පාන/01/06/නීති/04 ලිපිගොනුවට අනුව පාණදුර නගර සභාවේ අනවසර ඉදිකිරීම් සම්බන්ධ නඩු පැවරීමේ කටයුතු ප්‍රමාද වීම නිසා,කඩිනමින් නඩු කටයුතු සිදු කර ගැනීමට සභාවේ ලියාපදිංචි නීතිඥ මහතාට අමතරව,නීතිඥ සුගත් හඳුන්ගේ මහතාගේ සේවය ගාස්තු ගෙවා ලබාගැනීමට කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

නීතිඥ සුගත් හඳුන්ගේ මහතාගේ සේවය ,සභාව වෙත ලබාගැනීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

04. PUC/5/4/1/3-2022 වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීම ලිපිගොනුවෙහි සඳහන් නගර සභා කාර්යාලයේ සවිකර ඇති දැනට සී/ස රජයේ වාණිජ(විවිධ) නීතිගත සංස්ථාවේ වගකීම් කාලය පවතින වායු සමීකරණ යන්ත්‍ර 04 , 2022-2023 වර්ෂය වෙනුවෙන් වසරකට තුන් වරක් සේවා කිරීම සඳහා සී/ස රජයේ වාණිජ(විවිධ) නීතිගත සංස්ථා විසින් එවා ඇති සේවා කිරීමේ ගිවිසුම් පත්‍රය අනුව ගාස්තු පහත පරිදි වේ.

එක් වායු සමීකරණ යන්ත්‍රයක් සඳහා එක් සේවා වාරයක් සඳහා ගාස්තුව	= රු 5625.00
යන්ත්‍ර 04 සඳහා එක් සේවා වාරයක් සඳහා ගාස්තුව	= රු 5625.00 *4
	= රු 22500.00
සේවා වාර 03 ක් සඳහා වන ගාස්තුව	= රු 22500.00* 3
	= රු 67500.00
12% VAT	= රු 8100.00
මුළු මුදල	= රු 75,600.00

මීට අමතරව කොළඹ නගරයෙන් පිටත සේවා කිරීම් සඳහා ගමන් වියදම් සඳහා ගාස්තුවක්ද අයකරන බව දන්වා ඇත.ඒ අනුව වගකීම් කාලය ඇති වායුසමීකරණ යන්ත්‍ර 04 ,ඉහත ගාස්තු ගෙවමින් සී/ස රජයේ වාණිජ(විවිධ) නීතිගත සංස්ථා මඟින් සේවා කිරීම සඳහා එම ආයතනය සමඟ ගිවිසුම් ගත වීමට කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

වගකීම් කාලය පැවතුණද නොමිලේ සේවා කිරීමක් සිදු නොවන අතර අනෙකුත් වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීම සඳහා ලබාගත් ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් මෙම ආයතනය විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් වලට වඩා අඩු බැවින් අවම මිල ඉදිරිපත් කර ඇති ටෙන්ඩර්කරු මඟින් සේවා කිරීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

05. PUC/5/4/1/13-2022 ඉන්ධන ටැංකිය බහාලීම සඳහා කොන්ක්‍රීට් ටැංකියක් ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකසන ලද රු 1,170,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 1,170,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

06. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

6.1 PUC/05/03/01-14/2020 ලිපිගොනුවට අනුව RA-2516 අංක දරණ ට්‍රැක්ටර් රථය,Chandima Motors ආයතනය මඟින් අළුත්වැඩියා කර ගැනීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 340,865.00 ක මුදල ගෙවීමට කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 340,865.00 ක මුදල, Chandima Motors ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

6.2 PUC/05/03/01-05/2020 ලිපිගොනුවට අනුව ZA-2794 අංක දරණ JCB රථයේ විදුලි පද්ධතිය,J A Motors ආයතනය මඟින් අළුත්වැඩියා කර ගැනීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 11,520.00 ක මුදල ගෙවීමට කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රිලේ 02	- රු 2400.00
වයර් යාර 04	-රු 340.00
ටේප් රෝල් 01	- රු 130.00
වයර් ටයිට් 10	- රු 150.00
වැඩ කුලිය	- රු 8500.00
	රු 11520.00

රු 11,520.00 ක මුදල, J A Motors ආයතනය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

6.3 PUC/5/4/1/15/2022 සීසීටීවී කැමරා සවිකිරීම ලිපිගොනුවට අනුව පාණදුර නගර සභාවේ පිහිණුම් තටාකය,හඩ්සන් උද්‍යානය,වැඩ අංගනය,දුම්රියපළ අසල රථගාල හා ප්‍රධාන කාර්යාලයේ සරප් අංශය සඳහා සීසීටීවී කැමරා 05 ක්(එක් එක් ස්ථානයට තනි කැමරාව බැගින්) සවිකිරීමට හා ඒ සඳහා මිල ගණන් කැඳවීමට කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

පාණදුර නගර සභාවේ පිහිණුම් තටාකය,හඩ්සන් උද්‍යානය,වැඩ අංගනය,දුම්රියපළ අසල රථගාල හා ප්‍රධාන කාර්යාලයේ සරප් අංශය යන ස්ථාන සඳහා සීසීටීවී කැමරා 05 ක් ද තවත් එක් අතිරේක කැමරාවක් ද ඇතුළත්ව කැමරා 06 ක් සඳහා මිල ගණන් කැඳවමින් මිලදී ගැනීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.4 PUC/5/4/2/1-2022 සිරිල් සල්ගාදු මාවත කොන්ක්‍රීට් කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය වෙනුවෙන් කොන්ක්‍රීට් අයිතමයේ මිල ගණන් පමණක් සංශෝධනය කරමින් සකස් කරන ලද රු 1,920,424.54 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු1,920,424.54 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

6.5 PUC/5/4/1/5-2022 මිනුවන්පිටිය ආදාහනාගාරයේ අළුකුටි ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කරන ලද රු 1,600,000.00 ක් වූ සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 1,600,000.00 ක් වූ සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

6.6 පාන/5/4/ඔරලෝසු කණු/2018 හා ඔරලෝසු කණුව අලුත්වැඩියා කිරීම ලිපිගොනුවට අනුව,එහි සවිකර ඇති ඔරලෝසුව වාර්ෂික සේවා කිරීම සඳහා (2022.08.01 සිට 2023.08.01 දක්වා) ඩබ්.ඒ.ද සිල්වා මැනිෆැක්චර්ස් ආයතනය විසින් රු 40,000.00 ක සේවා ගිවිසුමක් ඉදිරිපත් කර ඇත.අදාළ රු 40,000.00 ක මුදල ගෙවමින් එම ආයතනය සමඟ ගිවිසුම්ගත වීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 40,000.00 ක මුදල ගෙවමින් ඩබ්.ඒ.ද සිල්වා මැනිෆැක්චර්ස් ආයතනය සමඟ ගිවිසුම් ගත වීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

6.7 සුමනධීර මාවත ඉඩමෙන් අනවසරයෙන් අත්පත් කර ගෙන ඇති ඉඩම් කොටස, සභාව සතුව බවට සනාථ කර ගැනීමට මහජන පෙත්සම් කාරක සභාව වෙත ආසන්නම පදිංචිකරුවන් ගෙන්වා ගනිමින් එම නිවෙස්වල සැලසුම් සභාව වෙත ලබාගත් අතර එම සැලසුම් උපයෝගී කර ගනිමින් සභාවෙහි අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කරන ලෙසත් සභාව සතු දේපළ සම්බන්ධ සියළු කටයුතු සංවර්ධන නිළධාරී ඉමල්කා මිය ඇතුළු සැලසුම් අංශය වෙත පවරා දීම සුදුසු බවත් ගරු සභාපතිතුමා විසින් පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟත්වය මත නිර්දේශ කරන ලදී.

6.8 කර්මාන්ත අංශයේ වැඩ කටයුතු අධීක්ෂණය ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා විසින් සිදුකරන බැවින් සභාව සතු යතුරු පැදිය එතුමාගේ පරිහරණය සඳහා ලබාදීමට කටයුතු කිරීමත් ඒ සඳහා හිස් ආවරණ(හෙල්මට්) 02 ක් මිලදී ගෙන ලබාදීමත් සුදුසු බව ගරු සභාපතිතුමා විසින් පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟත්වය මත නිර්දේශ කරන ලදී.

6.9 නගර ශාලාවේ වහල මතට ක්‍රීඩා පිටියේ සිට පන්දු පතිත වීමෙන් වහලය කැඩී යාමේ අවදානමක් ඇති බැවින් එම වහල අමානෝ ෂීට් දමා සකස් කිරීමට කටයුතු කරන ලෙස කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර2022.08.12 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ,අනුමත කිරීමට තීරණය විය.

(ඊ.1.12.4) 2022.08.18 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය

ඒ අනුව අදාළ නිර්දේශ ඇතුළත් 2022.08.18 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු වාර්තාව පහත පරිදි වේ.

පාණදුර නගර සභාව
මුදල් කමිටු රැස්වීම් වාර්තාව

දිනය :2022.08.18
වේලාව : පෙ.ව.10.00
ස්ථානය :පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
01	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
02	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
03	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
04	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත
05	ගරු නාගරික මන්ත්‍රී	කේ.ඩී.අශෝකා රත්නමාලි මිය	ඇත
06	ගරු නාගරික මන්ත්‍රී	කුමුදු ප්‍රනාන්දු මහතා	ඇත
07	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුදිගෝ මහතා	ඇත
08	ගරු නාගරික මන්ත්‍රී	පද්මා කොස්තා මිය	ඇත
09	ගරු නාගරික මන්ත්‍රී	ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය	ඇත

සහභාගී වූ වෙනත් නිලධාරී

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
01	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
02	ගණකාධිකාරී	තිලක් මුණසිංහ මහතා	ඇත
03	පරිපාලන නිළධාරී (වැ.බ)	කුමුදු අබේසේකර මිය	ඇත
04	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
05	අභ්‍යන්තර විගණන නිළධාරී	කේ.සී. ද සිල්වා මිය	ඇත
06	අංශ ප්‍රධානී (ආයතන)	කේ.ඩී.යූ.පී.ජයරත්න මිය	ඇත

07	අංශ ප්‍රධානී (වරිපනම්)	ඩී.ඩී.ඒ.එල්.ශ්‍රියාණි මිය	ඇත
08	අංශ ප්‍රධානී (කර්මාන්ත)	තමිලා විජයසිංහ මිය	ඇත
09	අංශ ප්‍රධානී (සෞඛ්‍ය)	එච්.ටී. හෙට්ටිආරච්චි මිය	ඇත
10	අංශ ප්‍රධානී (මිශ්‍ර ආදායම්)	ෂමිලා ධර්මරත්න මිය	ඇත
11	අංශ ප්‍රධානී (ගිණුම්)	ඒ.ඒ. චන්ද්‍රිකා මිය	ඇත
12	සංවර්ධන නිලධාරී (ප්‍රජා සංවර්ධන)	ඉරෝමි යසෝධා කුරුප්පු ආරච්චි මිය	ඇත
13	ආදායම් පරීක්ෂක	පී.එම්.පියල් පද්මචන්ද්‍ර මහතා	ඇත
14	ආදායම් පරීක්ෂක	ටී.සුනිල් ජයලාල් මහතා	ඇත
15	ආදායම් පරිපාලක (වැ.බ.)	එච්.එම්.කේ.කුලතුංග මහතා	ඇත
16	ආදායම් පරිපාලක (වැ.බ.)	ඩබ්.ඉරාන් ධර්මප්‍රිය මහතා	ඇත
17	ආදායම් පරිපාලක (වැ.බ.)	ශමීන් අනුෂ්ක මහතා	ඇත
18	ආදායම් පරිපාලක (වැ.බ.)	දර්ශණ ඒකනායක මහතා	ඇත
19	ආදායම් පරිපාලක (වැ.බ.)	තරංග ජනකමිණි මහතා	ඇත
20	ආදායම් පරිපාලක (වැ.බ.)	සුරේෂ් මධුරංග මහතා	ඇත

01. <u>වරිපනම් අංශය</u>

1.1 පහත සඳහන් අයදුම්පත් හා සහතික නිකුත් කිරීමේදී දැනට අයකරනු ලබන ගාස්තු වර්තමාන ලිපිද්‍රව්‍ය හා අනෙකුත් වියදම් සඳහා බැලීමේදී ප්‍රමාණවත් නොවන බැවින් අදාළ ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීමට මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

කාරණය	ආදායම් ශීර්ෂය	දැනට අයකරනු ලබන මුදල (රු)	සංශෝධනය කිරීමට යෝජිත මුදල (රු)
AT පෝරම ගාස්තු	124-2-1-0-4409	100.00	250.00
නොපවරා ගැනීමේ පෝරම ගාස්තු	124-2-1-0-4409	50.00	250.00
AT අයදුම්පත් පරීක්ෂා කිරීම	124-2-1-0-4403	250.00	500.00
නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම	124-2-1-0-4409	325.00	500.00
තක්සේරු වාර්තා නිකුත් කිරීම	124-2-1-0-4403	120.00	500.00
උධෘත නිකුත් කිරීම	124-2-1-0-4403	පළමු වසරට 50.00	500.00
		ඉතිරි වර්ෂ සඳහා 25.00	250.00

උධෘත නිකුත් කිරීම ප්‍රධාන වශයෙන් සිදුවන්නේ ළමුන් පාසල් වෙත ඇතුළත් කිරීමේදී බැවින් එම මුදල රු 500.00 ක් දක්වා වැඩි කිරීමට තමා එකඟ නොවන බව ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා විසින් කමිටුව වෙත පවසා සිටින ලදී.

ලිපිද්‍රව්‍ය වල මිල ගණන් අධික වීම මත ඉහත මිලගණන් සංශෝධනයට යෝජනා කළද ජනතාව මේවන විට මුහුණ දෙන්නාවූ ආර්ථික අපහසුතා සලකා බලමින් මේ අවස්ථාවේ මෙම සංශෝධනය සිදුනොකළ යුතු බවට ගරු සභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා, ගරු නාගරික මන්ත්‍රී ලලීන් රුද්‍රිගෝ මහතා , ගරු නාගරික මන්ත්‍රී පද්මා කොස්තා මිය හා ගරු නාගරික මන්ත්‍රී හර්ෂා මිහිරාණි මිය අදහස් දක්වන ලදී.

ඒ අනුව යෝජනවාට පක්ෂ සහිකයින්:

1.ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා
2. ගරු නාගරික මන්ත්‍රී කේ.ඩී.අශෝකා රත්නමාලි මිය
3. ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා

යෝජනාවට විපක්ෂ සහිකයින්:
1.ගරු සභාපති නන්දන ගුණතිලක මහතා
2.ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

3. ගරු නාගරික මන්ත්‍රී ලලීන් රුද්‍රිගෝ මහතා
4. ගරු නාගරික මන්ත්‍රී පද්මා කොස්තා මිය
5. ගරු නාගරික මන්ත්‍රී හර්ෂා මිහිරාණි මිය

ඒ අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා කමිටුවේ රැඳී නොසිටින ලදී.

ඒ අනුව යෝජනාවට පක්ෂව ඡන්ද 03 ක්ද විපක්ෂව ඡන්ද 05 ක්ද ඉදිරිපත් වූ බැවින් වැඩි ඡන්ද 02 කින් යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදී.

1.2 ලිපි ගොනු අංකය PUC/03/05/02/50/21

කොට්ඨාශ අංකය හා වීදිය	03, ජනප්‍රිය මාවත
අයිතිකරු	එම්.ඒ.අජිත් ශාන්ත මාරසිංහ
වරිපනම් අංක	85
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	රු 50187.50
වාර්ෂික වටිනාකම	රු.255,000/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.07.21
ඉල්ලීම	ව්‍යාපාරික ස්ථානය වසා දමා ඇති බැවින් වරිපනම් බදු ප්‍රතිශතය සංශෝධනය කරදෙන ලෙස
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ව්‍යාපාරික ස්ථානය වසා දමා ඇති බැවින් දැනට 2022/3 වන කාර්තුවේ සිට 5% ප්‍රතිශතයට බදු අයකිරීම

2022/3 වන කාර්තුවේ සිට 5% ප්‍රතිශතයට බදු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කළ අතර ඉල්ලුම්කරු විසින් හිඟ බදු මුදල් සඳහා ලබාදී තිබූ චෙක්පතක් මේවන විට අභුරු වී ඇති බැවින් අදාළ සංශෝධනය හිඟ බදු මුදල් අයකිරීමෙන් පසු සිදුකිරීමත් ඉදිරියට මොහු විසින් ඉදිරිපත් කරනු ලබන චෙක්පත් භාර ගැනීම සිදු නොකරන ලෙසත් මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1.3 ලිපි ගොනු අංකය PUC/03/06/02/104/2021

කොට්ඨාශ අංකය හා වීදිය	05, සංඝානන්ද මාවත
අයිතිකරු	අමරසිංහ හේවගේ ප්‍රේමදාස
වරිපනම් අංක	34A
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	නැත
වාර්ෂික වටිනාකම	රු.75,000/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.06.02
ඉල්ලීම	ව්‍යාපාරික ස්ථානයේ ව්‍යාපාරික කටයුතු සිදු නොකරන බැවින් බදු ප්‍රතිශතය අඩුකරන ලෙස
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ව්‍යාපාරික කටයුතු සිදු නොකරන බැවින් 2022/3 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අයකිරීම

ව්‍යාපාරික කටයුතු සිදු නොකරන බැවින් 2022/3 වන කාර්තුවේ සිට 5% නේවාසික ප්‍රතිශතයට බදු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1.4 ලිපි ගොනු අංකය PUC/03/06/02/74/2021

කොට්ඨාශ අංකය හා වීදිය	02, මහ වීදිය
අයිතිකරු	A.W.ගුණසේකර Y.S.H.M.ගුණසේකර
වරිපනම් අංක	305/03/01
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	නැත
වාර්ෂික වටිනාකම	රු.22,500/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.06.02
ඉල්ලීම	–
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	ව්‍යාපාරික කටයුතු ආරම්භ කර ඇති බැවින් 2022/3 වන කාර්තුවේ සිට 20% වාණිජ්‍ය ප්‍රතිශතයට බදු අයකිරීම

ව්‍යාපාරික කටයුතු නැවත ආරම්භ කර ඇති බැවින් 2022/3 වන කාර්තුවේ සිට 20% වාණිජ්‍ය ප්‍රතිශතයට බදු අයකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

1.5 ලිපි ගොනු අංකය PUC/03/06/02/74/2021

කොට්ඨාශ අංකය හා වීදිය	02, ආතර් වී දියෙස් මාවත
අයිතිකරු	P.ඩයනා කුමාරතුංග
වරිපනම් අංක	118 C
දේපල විස්තරය	වාණිජ්‍ය
හිග බදු මුදල	රු 9000/-
වාර්ෂික වටිනාකම	රු.6,000/-
සංශෝධන ඉල්ලීම් ලිපිය ලද දිනය	2022.08.05
ඉල්ලීම	2021 වර්ෂයේ ව්‍යාපාරික ස්ථානය වසා දමා ඇති බැවින් එකී රු 4500/- ක හිඟ මුදල සඳහා සාධාරණයක් කරන ලෙස
ආදායම් පරීක්ෂකගේ නිර්දේශය	2021.12.31 දිනට රු 4500/- ක හිඟ මුදලක් පවතින බැවින් එකී මුදල කොටස් කිහිපයකින් හෝ අයකර ගැනීම

2021.12.31 දිනට ඇති රු 4500/- ක හිඟ මුදල ,කොටස් 03 කින් අයකර ගැනීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

02. <u>මිශ්‍ර ආදායම් අංශය</u>

2.1 2022 වර්ෂය සඳහා එල් 04 කඩ කාමරය බදු ගැනීමට ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ තෙවන ලංසුකරු වන එම්.ආර්.එම්.රිෆ්කි අහමඩ් මයා විසින් සභාවේ තැන්පත් කරන ලද රු 15,000.00 ක ආපසු ගෙවන ලංසු පෝරම තැන්පත් මුදල් ආපසු ඉල්ලා ඇත.

මොහුට මෙම කඩ කාමරය බදු ලබා ගන්නා ලෙස දැන්වූ අතර එය අලුත්වැඩියා කර ගත යුතු බව දන්වා තිබුණි.පසුව එය ආදායම් පරීක්ෂක මහතුන් මඟින් පරීක්ෂා කළ අතර එම කඩ කාමරය අලුත්වැඩියා කළ යුතුබව වාර්තා කර ඇති බැවින් එය කඩිනමින් ඉටු කර දෙන මෙන් කර්මාන්ත අංශය දැනුවත් කරන ලදී.

එබැවින් එම්.ආර්.එම්.රිෆ්කි අහමඩ් මයා විසින් තැන්පත් කරන ලද රු 15,000.00 ක ආපසු ගෙවන තැන්පත් මුදල නිදහස් කිරීමට හැකි බැවින් එම මුදල නිදහස් කිරීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 15,000.00 ක ආපසු ගෙවන තැන්පත් මුදල නිදහස් කිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.2 කළුතර උතුර,අබෑ පාර නො.149/22 දරණ ලිපිනයේ පදිංචි ඩබ්.ටී.එම්.සිල්වා යන අය විසින් 2022.06.11 වන දින ක්‍රීඩා තරඟයක් පැවැත්වීම සඳහා පහත පරිදි මුදල් ගෙවා ඇත.

විස්තරය	ලදුපත් අංකය	මුදල(රු)
ක්‍රීඩා පිටිය වෙන් කිරීම	I 51663	6000.00
තැන්පතු මුදල	I 51661	5000.00
අයදුම්පත්‍ර ගාස්තුව	I 51662	500.00

නමුත් රටේ පැවැති උග්‍ර ඉන්ධන හිඟය හේතුවෙන් ක්‍රීඩකයින් රැස්කර ගැනීමට අපහසු වීම හේතුවෙන් මෙම වෙන් කිරීම සිදුකර නොමැති අතර 2022.07.14 දිනැතිව මුදල් ආපසු ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇත.
ක්‍රීඩා තරඟය නොපැවැත්වීම සඟාවේ ප්‍රමාදයක් නොවන බැවින් ක්‍රීඩා පිටිය වෙන් කිරීමේ මුදලින් 5% ක් රඳවා ඉතිරි මුදල වන රු 5700.00 ක මුදල ආපසු ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

ක්‍රීඩා පිටිය වෙන් කිරීමේ මුදලින් 5% ක් රඳවා ඉතිරි මුදල වන රු 5700.00 ක මුදල ආපසු ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.3 ජනප්‍රිය මාවත,වෙළඳපොළ පාර දෙපස දෛනිකව පොළ ගාස්තු අය කිරීමේදී,වෙළඳ මහත්ම මහත්මීන් විවිධ හේතු දක්වා පොළ ගාස්තු ගෙවීම මඟ හැරීමට උත්සහ කරන බවත්,එයින් ආදායම් පරීක්ෂකවරුන් මහත් අපහසුතාවයට පත්වන බවත්,ආදායම් පරීක්ෂක සුනිල් ජයලාල් මහතා සමඟ යාමේදී පමණක් මැසිවිලි නැගීමකින් තොරව වෙළෙන්දන් පොළ ගාස්තු ගෙවන බවත් සෙසු ආදායම් පරීක්ෂකවරු දන්වා ඇත.
එබැවින් ඔවුන්ගේ ඉල්ලීම අනුව,පොළ ගාස්තු අය කිරීම සඳහා ආදායම් පරීක්ෂක සුනිල් ජයලාල් මහතාව දෛනිකව යොදවා,අනෙක් ආදායම් පරීක්ෂකවරු සහයට යෙදවීම පිළිබඳව මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

පොළ ගාස්තු අයකිරීමට ආදායම් පරීක්ෂක සුනිල් ජයලාල් මහතා සමඟ අනෙකුත් ආදායම් පරිපාලක(වැ.බ) නිළධාරීන් යෙදවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කල අතර වාහන නැවතුම් ස්ථානයන්හී ගාස්තු අයකිරීමට ආදායම් පරිපාලක(වැ.බ) නිළධාරීන් දින 07 සඳහාම සේවා මුර ක්‍රමයක් යටතේ යෙදවීමට කටයුතු කරන ලෙසත් එහිදී ආදායම් පරිපාලක(වැ.බ) සුරේෂ් මධුරංග මහතා ඉන්ධන සම්බන්ධ කටයුතු වලද යෙදී සිටින බැවින් එම සේවා මුර ක්‍රමයට ඇතුළත් කර නොගන්නා ලෙසත් මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

03. <u>ආයතන අංශය</u>

3.1 කෙටි පණිවිඩ සේවාව පවත්වාගෙන යාම වෙනුවෙන් හා කෙටි පණිවිඩ නිකුත් කිරීම වෙනුවෙන් 2022 පෙබරවාරි මස සිට ජූනි මස දක්වා සභා ආවරණ අනුමැතියට යටත්ව නෙක්ෆා ආයතනයට ගෙවන ලද රු 17,618.95 ක මුදල, මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

නෙක්ෆා ආයතනයට ගෙවන ලද රු 17,618.95 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

3.2 වෙබ් අඩවිය පවත්වාගෙන යාම වෙනුවෙන් 2022 පෙබරවාරි මස සිට මැයි මස දක්වා සභා ආවරණ අනුමැතියට යටත්ව නෙක්ෆා ආයතනයට ගෙවන ලද රු 19,800.00 ක මුදල, මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

නෙක්ෆා ආයතනයට ගෙවන ලද රු 19,800.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

3.3 පාන/01/09/01/2019 ලිපි ගොනුවට අදාලව 2022 ජූනි මස සඳහා කාර්යාලයේ දුරකථන බිල්පත් ගාස්තු පහත සඳහන් වේ. සභා ආවරණ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත රු.**39,996.00** ක ගෙවූ මුදල , මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

සංකේත අංකය	දුරකථන අංකය	නම	කාල සීමාව	ගාස්තුව
124-1-1-0-1401	038-2232656	සභාපති කාර්යාලය	2022.06.01 සිට 2022.06.30	2460.55
	038-2249956	ලේකම්	2022.06.01 සිට 2022.06.30	345.40
	038-2232276	ෆැක්ස්/ඉන්ටර්නෙට්	2022.06.01 සිට 2022.06.30	6335.52

	038-2232285	උප සභාපති කාර්යාලය	2022.06.01 සිට 2022.06.30	1738.67
	038-3124635	පරිපාලන නිලධාරී	2022.06.01 සිට 2022.06.30	570.42
	038-2248477	ආයතන අංශය	2022.06.01 සිට 2022.06.30	2523.75
	038-3126384	කමිටු කාමරය	2022.06.16 සිට 2022.07.15	524.42
	038-2249955	අභ්‍යන්තර විගණන නිලධාරී	2022.06.16 සිට 2022.07.15	227.25
124-1-2-0-1401	038-3127416	ගිණුම් අංශය	2022.06.16 සිට 2022.07.15	717.62
124-3-5-3-1401	038-2241705	ආයුර්වේදය	2022.06.01 සිට 2022.06.30	1130.58
124-8-1-0-1401	038-2221422	කසල අංගණය	2022.06.01 සිට 2022.06.30	816.98
	038-3126174	කසල අංගණය රවුටරය	2022.06.16 සිට 2022.07.15	1702.85
124-4-3-0-1401	038-2249954	වැඩ අධිකාරී කාර්යාලය	2022.06.16 සිට 2022.07.15	314.91
	038-2249950	කර්මාන්ත අංශය	2022.06.16 සිට 2022.07.15	1912.60
	038-3127580	සූර්ය පැනලයේ රවුටරය	2022.06.01 සිට 2022.06.30	514.28
	038-3127405	නගර ශාලාව	2022.06.16 සිට 2022.07.15	775.12
124-3-1-0-1401	038-2249952	සෞඛ්‍ය අංශය	2022.06.16 සිට 2022.07.15	997.18
	038-3127406	මිනුවම්පිටිය සුසාන භූමිය	2022.06.16 සිට 2022.07.15	931.53
	038-2249957	වරිපනම් අංශය	2022.06.01 සිට 2022.06.30 (PEO TV ලබාගත් බැවින් එම මුදල මෙම දුරකථනයට එකතු කරන ලදී.)	9720.14
124-6-3-0-1401	038-2243299	පුස්තකාලය	2022.06.01 සිට 2022.06.30	3928.12
	038-3120069	ප්‍රජා සංවර්ධන අංශය	2022.06.01 සිට 2022.06.30	1808.11
			එකතුව	**39996.00**

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවන ලද රු.39,996.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

3.4 පාන/01/09/02/2021 පොදු ලිපි ගොනුවට අදාල 2018 වර්ෂයේ පත්වූ නාගරික මන්ත්‍රීතුමන්ලාගේ 2022 අප්‍රේල්, මැයි හා ජූනි මාසයන්හී නිවාස දුරකථන බිල්පත් වෙනුවෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද රු.12,750/= ක මුදල , මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

නම	දුරකථන අංකය	කාලය	එකතුව
ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා	038-2240927	2022.05.01 සිට 2022.05.31	3000.00
		2022.06.01 සිට 2022.06.30	3000.00
ගරු නාගරික මන්ත්‍රී - අශෝකා රත්නමාලි මිය	038-2248358	2022.06.01 සිට 2022.06.30	2250.00
ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා මහතා	038-2237700	2022.04.01 සිට 2022.04.30	2250.00
ගරු නාගරික මන්ත්‍රී - පද්මා කොස්තා මිය	038-2234657	2022.06.01 සිට 2022.06.30	2250.00
		එකතුව	**12,750.00**

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවන ලද රු.12,750.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

3.5 PUC/1/3/2/18/2021 ලිපිගොනුවට අනුව ,වර්තමානයේ රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් පාණදුර නගර සභාවට ලැබිය යුතු ආදායම් ද යම් තරමකට අහිමි වීමක් සිදුව ඇති බැවින්,හැකි උපරිම අන්දමින් වියදම් අවම කර ගැනීමට කටයුතු කළ යුතුව ඇත.ඒ අනුව බස්නාහිර පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය මඟින් මේවන විට සභාවේ පරිශ්‍රයන්හී ආරක්ෂක සේවය සඳහා සේවකයින් 09 දෙනෙකු යොදවා ඇත.ඒ අතුරින් පහත සඳහන් ස්ථානයන්හී දිවා මුර සඳහා යොදවා ඇති සේවකයින් 03 දෙනෙකු අඩුකර,එම රාජකාරී සභා සේවකයින් මඟින් ආවරණය කර ගැනීමට මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

1. ප්‍රධාන කාර්යාලය
2. මිනුවම්පිටිය සුසාන භූමිය
3. කසළ අංගනය

සභාවේ ආදායම් තත්ත්වය සලකා බලමින් ප්‍රධාන කාර්යාලය, මිනුවම්පිටිය සුසාන භූමිය, කසළ අංගනය යන ස්ථානයන්හී දිවා මුර සේවය සඳහා යොදවා ඇති වෙස්ප්‍රෝ ආරක්ෂක සේවකයින් හා පිහිණුම් තටාකයේ රාත්‍රී මුර සේවය සඳහා යොදවා ඇති වෙස්ප්‍රෝ ආරක්ෂක සේවකයින් අඩුකර එම රාජකාරී සභා සේවකයින් මඟින් ආවරණය කර ගැනීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

04. <u>සෞඛ්‍ය අංශය</u>

4.1 UCP/06/03/02/2022 ලිපි ගොනුවට අනුව 2022.05.01 සිට 2022.05.31 දක්වා ගල්කිස්ස අපජල පද්ධතියට මළාපවහන මුදාහැරීම වෙනුවෙන් මළාපවහන ගාස්තු වශයෙන් , ලෝඩ් එකක් මුදාහැරීම සඳහා රු.2000/- බැගින් ලෝඩ් 23 ක් සඳහා රු.51,520/- (VAT සමඟ) ක මුදල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු.51,520/- ක මුදල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.2 UCP/06/03/02/2022 ලිපි ගොනුවට අනුව 2022.06.01 සිට 2022.06.30 දක්වා ගල්කිස්ස අපජල පද්ධතියට මළාපවහන මුදාහැරීම වෙනුවෙන් මළාපවහන ගාස්තු වශයෙන් , ලෝඩ් එකක් මුදාහැරීම සඳහා රු.2000/- බැගින් ලෝඩ් 43 ක් සඳහා රු.96,320/- (VAT සමඟ) ක මුදල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු.96,320/- ක මුදල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

4.3 සෞඛ්‍ය අංශයේ ඇති ඡායාපිටපත් යන්ත්‍රයෙන් ,පිටත පුද්ගලයන් සඳහා ඡායාපිටපත් නිකුත් කිරීමේදී අයකරනු ලබන රු 5.00 ක මුදල රු 10.00 දක්වා වැඩිකර අයකිරීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

සෞඛ්‍ය අංශයේ ඇති ඡායාපිටපත් යන්ත්‍රයෙන් ,පිටත පුද්ගලයන් සඳහා ඡායාපිටපත් නිකුත් කිරීමේදී අයකරනු ලබන රු 5.00 ක මුදල රු 10.00 දක්වා වැඩිකිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

05. <u>ප්‍රජා සංවර්ධන අංශය</u>

5.1 පාණදුර නගර සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල අවුරුද්දක් වයසැති ළදරුවන් 36 දෙනෙකු වෙත ලබාදීමට නියමිත රු 3500.00 ක් වූ උපකරණ කට්ටලයට ලබාදීමට නියමිත පහත භාණ්ඩ ,මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

අනු අංකය	භාණ්ඩ වර්ගය	මිල(රු)
01	බේබි සබන් (75g) කැට 05	1000.00
02	බේබි ඩයපර්ස් (4 ඇසුරුම) පැකට් 01 ක්	600.00
03	බේබි ක්‍රීම් (200 g) බෝතල් 01 ක්	500.00
04	සීරියල් පැකට් 01 ක්	750.00
05	බේබි ක්ලෝන් පැක් 01 ක්	650.00
එක් කට්ටලයක් සඳහා මුළු මුදල		3500.00

අඩු ආදායම්ලාභී පවුල්වල අවුරුද්දක් වයසැති ළදරුවන් වෙත ලබාදෙන්නාවූ රු 3500.00 ක් වූ උපකරණ කට්ටලයට පහත භාණ්ඩ ලබාදීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලද්.

අනු අංකය	භාණ්ඩ වර්ගය	මිල(රු)
01	**බේබි සබන් (75g) කැට 05**	**1000.00**
02	**බේබි ඩයපර්ස් (4 ඇසුරුම) පැකට් 01 ක්**	**600.00**
03	**බේබි ක්‍රීම් (200 g) බෝතල් 01 ක්**	**500.00**
04	**සීරියල් පැකට් 01 ක්**	**750.00**
05	**බේබි ක්ලෝන් පැක් 01 ක් (බෝතල් 03 ක් සහිත)**	**650.00**

06. ගිණුම් අංශය

6.1 Puc/02/01/05/2022 ලිපිගොනුවට අනුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත 2022 වර්ෂයේ දෙවන කාර්තුවට අදාළව සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද මුද්දර තැන්පත් මුදල වන රු 40,865.00 ක මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත රු 40,865.00 ක මුදල ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.2 puc/Ac7/ආයුර්වේද/2021 ලිපිගොනුවට අදාළව ආයුර්වේද මධ්‍යස්ථානයට අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් Sri Lanka Auruwedic Drugs corporation ආයතනය වෙත රු.480,315.00 ක් සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල ,මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

Sri Lanka Auruwedic Drugs corporation ආයතනය වෙත ගෙවූ රු.480,315.00 මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.3 puc/Ac7/G-07/2022 ලිපිගොනුවට අදාළව C 25W Grade concrete ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් Tokyo Supermix(pvt)ltd ආයතනය වෙත රු.175,392.00 ක් සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

Readymix Concrete c25/200 රු 43848.00 x 4 =175392.00

Tokyo Supermix (pvt) ltd ආයතනය වෙත ගෙවූ රු.175,392.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.4 puc/Ac7/G-04/2022 ලිපිගොනුවට අදාළව වාචික උපදෙස් මත මිලට ගත් අත්‍යවශ්‍ය භාණ්ඩ හා උපාංග වෙනුවෙන් වෙනුවෙන් සී/ස පානදුර විවිධ සේවා සමුපාකාර සමිතිය වෙත රු.56246.00 ක් සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

4'pvc බට	200.00x3	= 600.00
4' එල්බෝ	595.00x1	= 595.00
හයි ස්පීඩ් තල	275.00x1	= 275.00
1'ස්ටොක් වැල්	485.00x6	= 2910.00
ඉබි යතුරු	480.00x1	= 480.00
ඉබි යතුරු 1¼	290.00x2	= 580.00
ඩ්‍රොවර් ලොක්	290.00x1	= 290.00
මී කූඩු	620.00x10	= 6200.00
කේසින් 1'	395.00x5	= 1975.00
ඉබි යතුරු	190.00x2	= 380.00
කොන්ඩ් පට්ටම්	90.00x2	= 180.00
විසිකැති	650.00 x2	= 1300.00
රේක්ක	790.00 x2	= 1580.00
1½ pvc බට	2600.00 x3	= 7800.00
1½ pvc එල්බෝ	275.00 x5	= 1375.00
ඉබි යතුරු	330.00 x1	= 330.00
කේසින් 1'	530.00 x10	= 5300.00
බැටරි	60.00 x12	= 720.00
ගොගොල්	170.00 x01	= 170.00
කප් බ්‍රෂ්	270.00 x01	= 270.00
ටෙස්ටර්	100.00 x01	= 100.00
වෝල් ප්ලග් NO12	10.00 x10	= 100.00
1' ස්කෘ ඇණ	3.50 x50	= 175.00
1' කොන් / ඇණ	2.50 x50	= 125.00
වෝල් ප්ලග්	2.00 x50	= 100.00
¾ පෙක්/කන්/බෙන්ඩ්	160.00x3m	= 480.00
ඩයමන් ඩිවික් 4½	1000.00 x01	= 1000.00
කොන්ඩ් පට්ටම්	120 x01	= 120.00

ස්කෑ ඇණ	3.00 x07	= 21.00
ප්ලාස්ටික් ඉදල්	400 x10	= 4000.00
4''PVC එල්බෝ	930 x01	= 930.00
PVC බට	10.00 x20	= 200.00
ඉබි යතුරු	480.00x01	= 480.00
ගේට් වැල්	255.00x01	= 255.00
වයල් ෂොකට්	80.00x02	= 160.00
ෂීට් ඇණ	20.00x30	= 600.00
වොෂර්	10.00x30	= 300.00
කම්බි ඇණ	250g	= 250.00
1½ කොෆ්/ඇණ	3.00x30	= 90.00
සවල්	1850.00x6	=11100.00
¾ පේන්ට් බ්‍රෂ්	225.00x1	= 225.00
පොප් රිවට් 3/16	3.50x50	= 175.00
1 එල්බෝ	160.00x01	= 160.00
1 බෙන්ඩ්	220.00x01	= 220.00
වයිපර්	300.00x04	= 1200.00
ඩිල් කටු¼	70.00x01	= 70.00
ඩිල් කටු3/16	50.00x01	= 50.00
ෂීට් ඇණ	25.00x10	= 250.00

සී/ස පානදුර විවිධ සේවා සමුපාකාර සමිතිය වෙත ගෙවූ රු.56,246.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.5 puc/Ac7/G-04/2022 ලිපිගොනුවට අදාළව කර්මාන්ත අංශයේ ඉල්ලීම අනුව මිලට ගත් යකඩ උපාංග වෙනුවෙන් මොරටුව,Dileep steel ආයතනය වෙත රු.263,375.00 ක් සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

වෙල්ඩින් කූරු 12''	රු 2312.50 x 10	= 23125.00
¾'' බොක්ස් බාර්	රු 3850.00 x 15	= 57750.00
½'' Gi බට	රු 4200.00 x 20	= 84000.00
1¼'' Gi බට	රු 9850.00 x 10	= 98500.00
		=263,375.00

Dileep steel ආයතනය වෙත ගෙවූ රු.263,375.00 ක මුදල, මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.6 UCP/Ac7/KIOSK/යන්ත්‍ර/2022 ලිපිගොනුවට අදාළව KIOSK මැෂිම මිලදී ගැනීම වෙනුවෙන් Mega Pay (pvt)ltd ආයතනය වෙත රු.800,000.00 ක මුදලක් සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

Mega Pay (pvt)ltd ආයතනය වෙත ගෙවූ රු.800,000.00 ක මුදල ,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.7 Puc/AC7/vehi rent/2022 ලිපිගොනුවට අදාළව කාර්යාලයේ අවශ්‍යතා මත ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමට කුලී පදනම යටතේ ලබා ගත් මෝටර් රථය වෙනුවෙන් වලපල Sathya rent A Car & Cabs ආයතනයට රු. 45,000.00 ක් සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

2022.07.01-2022.07.15 දින දක්වා දින 15ක් වෙනුවෙන් රු3000.00 x15 = රු. 45000.00

Sathya rent A Car & Cabs ආයතනය වෙත ගෙවූ රු. 45,000.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

6.8 Puc/AC7/vehi rent/2022 ලිපිගොනුවට අදාළව කාර්යාලයේ අවශ්‍යතා මත ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමට කුලී පදනම යටතේ ලබා ගත් මෝටර් රථය වෙනුවෙන් වලපල Sathya rent A Car & Cabs ආයතනයට රු. 45,000.00 ක් සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ අතර එම මුදල, මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

2022.07.16-2022.07.31 දින දක්වා දින 15ක් වෙනුවෙන් 3000.00 x15 = රු. 45000.00

Sathya rent A Car & Cabs ආයතනය වෙත ගෙවූ රු. 45,000.00 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

07. <u>කර්මාන්තඅංශය</u>

7.1 PUC/05/03/02-02/2021 ලිපි ගොනුවට අනුව 2022 ජූලි මාසයේ නගර සභා වාහන වෙනුවෙන් නිකුත් කරන ලද පෙට්‍රල් ඉන්ධන සඳහා එච්.ඩී.පිරිස් සහ සමාගම වෙත ගෙවිය යුතු රු.58,065.00 ක මුදල එම ආයතනයට ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු.58,065.00 ක මුදල, එච්.ඩී.පිරිස් සහ සමාගම වෙත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.2 PUC/05/03/02-01/2022 ලිපි ගොනුවට අනුව 2022 ජූලි මාසයේ නගර සභා වාහන වෙනුවෙන් නිකුත් කරන ලද ඩීසල් ඉන්ධන සඳහා එච්.ඩී.පිරිස් සහ සමාගම වෙත ගෙවිය යුතු රු.852,660.00 ක මුදල එම ආයතනයට ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු.852,660.00 ක මුදල, එච්.ඩී.පිරිස් සහ සමාගම වෙත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.3 PUC/05/03/02-01/2022 ලිපි ගොනුවට අනුව 2022 ජූනි හා ජූලි මාසයේ නගර සභා වාහන වෙනුවෙන් නිකුත් කරන ලද ඩීසල් ඉන්ධන සඳහා Panadura Auto Service & Filing Station ආයතනය වෙත ගෙවිය යුතු රු.288,680.00(රු 110,180.00+ රු 178,500.00) ක මුදල එම ආයතනයට ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු.288,680.00 ක මුදල, Panadura Auto Service & Filing Station ආයතනය වෙත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.4 UCP/05/02/02/2022 ලිපි ගොනුවට අනුව පාණදුර නගර සභාවට අයත් ගොඩනැගිලි වල 2022 අගෝස්තු මස දක්වා ලැබී ඇති ජල බිල්පත් වෙනුවෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.56,132.47 ක මුදල,මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ගෙවූ රු 56,132.47 ක මුදල,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

<u>2022.08.12 වන දින කර්මාන්ත කමිටුවෙන් නිර්දේශ වී මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලද කරුණු</u>

7.5 PUC/05/03/01-02/2020 ලිපිගොනුවට අනුව LL-7533 අංක දරණ කෘ කැබ් රථය,Panadura Auto Service ආයතනය මඟින් සේවා කිරීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 19,520.00 ක මුදල ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

Panadura Auto Service ආයතනය වෙත රු 19,520.00 ක මුදල ගෙවීම ,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.6PUC/5/4/1/13-2022 ඉන්ධන ටැංකිය බහාලීම සඳහා කොන්ක්‍රීට් ටැංකියක් ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකසන ලද රු 1,170,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 1,170,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව ,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.7PUC/05/03/01-14/2020 ලිපිගොනුවට අනුව RA-2516 අංක දරණ ට්‍රැක්ටර් රථය,Chandima Motors ආයතනය මඟින් අළුත්වැඩියා කර ගැනීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 340,865.00 ක මුදල ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

Chandima Motors ආයතනය වෙත රු 340,865.00 ක මුදල ගෙවීම ,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.8PUC/05/03/01-05/2020 ලිපිගොනුවට අනුව ZA-2794 අංක දරණ JCB රථයේ විදුලි පද්ධතිය,J A Motors ආයතනය මඟින් අළුත්වැඩියා කර ගැනීම නිසා එම ආයතනයට ගෙවිය යුතු රු 11,520.00 ක මුදල ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රිලේ 02	- රු 2400.00
වයර් යාර 04	-රු 340.00
ටේප් රෝල් 01	- රු 130.00
වයර් ටයිට් 10	- රු 150.00
වැඩ කුලිය	- රු 8500.00
	රු 11520.00

J A Motors ආයතනය වෙත රු 11,520.00 ක මුදල ගෙවීම ,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.9PUC/5/4/2/1-2022 සිරිල් සල්ගාදු මාවත කොන්ක්‍රීට් කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය වෙනුවෙන් කොන්ක්‍රීට් අයිතමයේ මිල ගණන් පමණක් සංශෝධනය කරමින් සකස් කරන ලද රු 1,920,424.54 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 1,920,424.54 ක ඇස්තමේන්තුව,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.10 PUC/5/4/1/5-2022 මිනුවන්පිටිය ආදාහනාගාරයේ අළුකුටි ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කරන ලද රු 1,600,000.00 ක් වූ සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 1,600,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

7.11 පාන/5/4/ඔරලෝසු කණු/2018 හා ඔරලෝසු කණුව අලුත්වැඩියා කිරීම ලිපිගොනුවට අනුව,එහි සවිකර ඇති ඔරලෝසුව වාර්ෂික සේවා කිරීම සඳහා (2022.08.01 සිට 2023.08.01 දක්වා) ඩබ්.ඒ.ද සිල්වා මැනිෆැක්චර්ස් ආයතනය විසින් රු 40,000.00 ක සේවා ගිවිසුමක් ඉදිරිපත් කර ඇත.අදාළ රු 40,000.00 ක මුදල ගෙවමින් එම ආයතනය සමඟ ගිවිසුම්ගත වීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

ඩබ්.ඒ.ද සිල්වා මැනිෆැක්චර්ස් ආයතනය වෙත රු 40,000.00 ක මුදල ගෙවමින් එම ආයතනය සමඟ ගිවිසුම්ගත වීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

08.සාකච්ඡා කරන ලද වෙනත් කරුණු

8.1 <u>මිශ්‍ර ආදායම් අංශය</u>

8.1.1 පාණදුර ,බෙක්කේගම,ශ්‍රී දේවානන්ද පාර,නො.29/1 ලිපිනයේ පදිංචි කේ.ඒ.සුමිත්‍රා ඇන්තනී අය විසින් 2020.09.27 වන දින නගර ශාලාව වෙන් කිරීම වෙනුවෙන් 2019.08.19 වන දින ලදුපත් අංක I 28133 මඟින් රු 5000.00 ක මුදලක් තැන්පත් කර ඇති අතර එම තැන්පතුව ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇත.මෙම තැන්පතුව ආදායමට මාරු කර ඇති බැවින් එය ආපසු ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 5000.00 ක තැන්පත් මුදල ආපසු ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.1.2 පාණදුර,මෙතෝදිස්ත පල්ලිය මඟින් 2021.05.01 වන දින ක්‍රීඩා තරඟයක් පැවැත්වීම සඳහා පහත පරිදි මුදල් ගෙවා ඇත.

විස්තරය	ලදුපත් අංකය	මුදල(රු)
ක්‍රීඩා පිටිය වෙන් කිරීම	I 43799	6000.00
තැන්පතු මුදල	I 43801	5000.00
අයදුම්පත්‍ර ගාස්තුව	I 43800	500.00

නමුත් රටේ පැවැති තත්ත්වය හේතුවෙන් මෙම වෙන් කිරීම සිදුකර නොමැති අතර 2022.07.28 දිනැතිව මුදල් ආපසු ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇත.

ක්‍රීඩා තරඟය නොපැවැත්වීම සභාවේ ප්‍රමාදයක් නොවන බැවින් ක්‍රීඩා පිටිය වෙන් කිරීමේ මුදලින් 5% ක් රඳවා ඉතිරි මුදල වන රු 5700.00 ක මුදල ආපසු ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

ක්‍රීඩා පිටිය වෙන් කිරීමේ මුදලින් 5% ක් රඳවා ඉතිරි මුදල වන රු 5700.00 ක මුදල ආපසු ගෙවීම,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.1.3 පිහිණුම් තටාකයේ දැනට පවතින ගාස්තු,මුදල් හුවමාරු කිරීමේ අපහසුතා නිසා පහත පරිදි සංශෝධනය කිරීමට මුදල් කමිටු නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

දැනට පවතින ගාස්තු (රු)	සංශෝධනය කිරීමට යෝජිත මුදල
රු 45.00	රු 50.00
රු 90.00	රු 100.00
රු 200.00	සංශෝධනය නොවේ.

පිහිණුම් තටාකයේ දැනට පවතින ගාස්තු පහත පරිදි සංශෝධනය කිරීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරනු ලදී.

දැනට පවතින ගාස්තු (රු)	සංශෝධිත මුදල(රු)
රු 45.00	**රු 50.00**
රු 90.00	**රු 100.00**
රු 200.00	**සංශෝධනය නොවේ.**

8.2 **<u>ගිණුම් අංශය</u>**

8.2.1 PUC/02/05/06/01/2022 ලිපිගොනුවට අනුව 2022 වර්ෂයේ ඉදිරි මාසයන් සඳහා මුදල් ප්‍රතිපාදන නොමැති වැය විෂයයන් ඇතුලත්ව සකස් කල පරිපූරක ඇස්තමේන්තු දෙක මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

<u>පරිපූරක ඇස්තමේන්තුව 01-2022</u>

2022 වර්ෂයේ ඉඩම් විකිණීම මත අයකරන ලද 1% බදු මුදල වන රු 1000000.00 සඳහා වූ පරිපූරක ඇස්තමේන්තුව

මාරු අංකය	ඉල්ලීම් දිනය	අමතරව ලැබී ඇති මුදල	ඉල්ලුම් කරන මුදල	වැය විස්තරය	මුදල් අවශ්‍ය වැය ශීර්ෂය
පරිපූරක 01	2022.08.01	1,000,000.00	1,000,000.00	සවිකිරීම්, අලුත්වැඩියා හා නඩත්තු	124-1-1-1303

<u>පරිපූරක ඇස්තමේන්තුව 02-2022</u>

2019 වර්ෂයේ තුල බිල්කල මුද්දර ආදායම රු 14,814,435.00 කි.එහෙත් එම වර්ෂයට අදාළව 2022.05.24 දින වන විට රු 22,127,910.00 ක මුද්දර ගාස්තු ආදායමක් ලැබී ඇත.ඒ අනුව 2019 ලැබිය යුතු මුද්දර ගාස්තු ඉක්මවා අතිරේකව රු 7,313,475.00 ක මුදලක් ලැබී ඇත.එම රු 7,313,475.00 ක් සඳහා වූ පරිපූරක ඇස්තමේන්තුව

මාරු අංකය	ඉල්ලීම් දිනය	අමතරව ලැබී ඇති මුදල	ඉල්ලුම් කරන මුදල	වැය විස්තරය	මුදල් අවශ්‍ය වැය ශීර්ෂය
පරිපූරක 02	2022.08.01	7,313,475.00	2,300,000.00	ඉන්ධන	124-3-1-1208
	2022.08.01		500,000.00	ප්‍රවාහන ගාස්තු	124-1-1-1412(11)
	2022.08.01		2,000,000.00	ඉන්ධන	124-1-1-1208
	2022.08.01		2,500,000.00	බෝග වගා ව්‍යාපෘතිය	124-1-1-1249(11)
		එකතුව	7,300,000.00		

රු 1000000.00 ක් සඳහා වූ පරිපූරක ඇස්තමේන්තුව හා රු 7,313,475.00 ක් සඳහා වූ පරිපූරක ඇස්තමේන්තුව මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.3 <u>ආයතන අංශය</u>

8.3.1 PUC/1/3/18/2021 ලිපි ගොනුවට අනුව පාණදුර නගර සභාවේ යොදවා ඇති බස්නාහිර පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වෙස්ප්‍රෝ ආයතනයේ ආරක්ෂක නිලධාරීන් සඳහා 2022 ජූලි මස දීමනා ගෙවීම වෙනුවෙන් සභා ආවරණ අනුමැතියට යටත්ව, එකී ආයතනය වෙත ගෙවන ලද රු.471,820.00 ක මුදල, මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු.471,820.00 ක මුදල , වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය වෙත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.4 <u>ප්‍රජා සංවර්ධන අංශය</u>

8.4.1 මහා සභා අනුමැතියට යටත්ව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක් වන නගර සභා පරිශ්‍රය තුළ සකස් කරන ලද පැල තවානෙහි බණ්ඩක්කා හා තක්කාලි පැල බඳුන් ,ආයතනික සේවක මහත්ම මහත්මීන් වෙත අලෙවි කිරීමෙන් පසු තවදුරටත් පැල විශාල ප්‍රමාණයක් ඉතිරි වී ඇත.ඒ අනුව එම පැල,පැල 02 ක් සහිත බඳුනක් රු 15.00 කට හා පැල 02 කට වඩා ඇති බඳුනක් රු 20.00 ක මුදලකට මහජනතාව වෙත ලබාදීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

මහජනතාව වෙත පැල 02 ක් සහිත බඳුනක් රු 20.00 කට හා පැල 02 කට වඩා ඇති බඳුනක් රු 25.00 ක මුදලකට ලබාදීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

8.5 <u>කර්මාන්ත අංශය</u>

8.5.1 UCP/05/02/01/2022 ලිපි ගොනුවට අනුව පාණදුර නගර සභාවට අයත් ගොඩනැගිලි වල (නගර ශාලාව සමග) 2022 අගෝස්තු මස දක්වා ලැබී ඇති විදුලි බිල්පත් වෙනුවෙන් සී/ස ලංකා විදුලි (පෞද්) සමාගම වෙත සභා ආවරණ අනුමැතියට යටත්ව ගෙවූ රු.127,710.72 ක මුදල,මුදල් කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කරන ලදී.

රු.127,710.72 ක මුදල සී/ස ලංකා විදුලි (පෞද්) සමාගම වෙත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර2022.08.18 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු නිර්දේශ,අනුමත කිරීමට තීරණය විය.

(ඊ.1.12.5) 2022.08.24 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය

ඒ අනුව අදාළ නිර්දේශ ඇතුළත් 2022.08.24 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව පහත පරිදි වේ.

<u>පාණදුර නගර සභාව</u>

<u>කර්මාන්ත හා නගර සභා දේපළ සංරක්ෂණ කමිටු වාර්තාව</u>

දිනය : - 2022.08.24

වේලාව : - පෙ.ව. 11.00

ස්ථානය : - පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයින්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
2	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
3	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
4	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත
5	ගරු නාගරික මන්ත්‍රී	එම්. පියසේන ප්‍රනාන්දු මහතා	ඇත
6	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුදිගෝ මහතා	ඇත
7	ගරු නාගරික මන්ත්‍රී	මහින්ද පුන්සිරි මහතා	නැත
8	ගරු නාගරික මන්ත්‍රී	ආර්. බන්දුල සොයිසා මහතා	ඇත
9	ගරු නාගරික මන්ත්‍රී	ආර්.ඒ.හර්ෂා මිහිරාණි රණසිංහ මිය	ඇත

සහභාගී වූ වෙනත් නිළධාරීන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
1	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
2	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
3	තාක්ෂණ නිළධාරී	එස්.ඩී.ආර්. තුෂාරා මිය	ඇත
4	තාක්ෂණ නිළධාරී	ප්‍රසාදි විජේරත්න මිය	ඇත
6	අංශ ප්‍රධානී (කර්මාන්ත)	තමිලා විජයසිංහ මිය	ඇත

01. PUC/5/4/2/5/2022 මිනුවන්පිටිය සුසාන භූමිය වටා තාප්පය ඉදිකිරීම ලිපිගොනුවට අනුව මෙම කර්මාන්තය පළාත් සභා ව්‍යාපෘති යෝජනාවක් ලෙස ඉදිරිපත් වී ඇති යෝජනාවකි.පැවති මිල ගණන් ඉහල යාම මත ව්‍යාපෘතියේ වැඩ එක් කොටසක් පමණක් ඉටු කර ඇති අතර එම කොටස සතුටුදායක තත්ත්වයේ පවතී.ඉතිරි වැඩ කොටස නිම කළ නොහැකි බව කොන්ත්‍රාත්කරු වාචිකව දැනුවත් කර ඇත.අවසාන බිල්පතෙහි සම්පූර්ණ මුදල රු 775,572.18 ක් වේ.එම මුදලින් රු 77,557.22 ක් වූ 10% අතරඳවුම් මුදල අඩුකර රු 698,014.96 ක මුදල, ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීමටත්, අවසාන බිල්පතෙහි සම්පූර්ණ මුදල වන රු 775,572.18 ක මුදල පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ගෙන්වා ගැනීමටත් කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 698,014.96 ක මුදල, ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීමත්, අවසාන බිල්පතෙහි සම්පූර්ණ මුදල වන රු 775,572.18 ක මුදල පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ගෙන්වා ගැනීමත් කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය සඳහා රු 1,000,000.00 ප්‍රතිපාදන වෙන්කළ බැවින් ඉතිරි රු 224,427.82 ක මුදලින් එම තාප්පයේ කපරාරු වැඩ ටික සෘජු ශ්‍රමික පදනමින් ඉටු කිරීමට කටයුතු කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා විසින් පවසා සිටි අතර ඒ අනුව එසේ සිදුකිරීමට ඇති හැකියාව පිළිබඳව සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් විමසීම් සිදුකර එම කාර්යය ඉටු කිරීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

02. PUC/05/03/01-04/2020 ලිපිගොනුවට අනුව LK-0776 අංක දරණ ටිපර් රථය සඳහා රක්ෂණ බලපත්‍රය ලබාගැනීම වෙනුවෙන් ,Sri Lanka Insurance ආයතනය වෙත ගෙවිය යුතු රු 11,009.51 ක මුදල ගෙවීමට කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

Sri Lanka Insurance ආයතනය වෙත රු 11,009.51 ක මුදල ගෙවීම කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

03. PUC/5/4/1/16/2022 ශ්‍රී මහා විහාර පාර,නිමල්කා උද්‍යාන පාරෙහි බෝක්කුව ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකසන ලද රු 425,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 425,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

04. PUC/5/4/1/16/2022 ශ්‍රී මහා විහාර පාරේ අතුරු පාරෙහි බෝක්කුව ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකසන ලද රු 275,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 275,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

05. <u>සාකච්ඡා කරන ලද වෙනත් කරුණු</u>

5.1 PUC/5/4/1/13-2022 ඉන්ධන ටැංකිය බහාලීම සඳහා කොන්ක්‍රීට් ටැංකියක් ඉදිකිරීම ලිපිගොනුවට අනුව එම ව්‍යාපෘතියේ කොටස් ගෙවීමක් වන රු 923,519.26 ක මුදල, ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීම සඳහා කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 923,519.26 ක මුදල, ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

5.2 PUC/5/4/3/35/2020 ප්‍රධාන පුස්තකාලයේ වැසිකිළිය සකස් කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකසන ලද රු 2,354,314.03 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 2,354,314.03 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

5.3 රාජ්‍ය වියදම් පාලනය කර ගැනීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛය මඟින් නව ව්‍යාපෘති ආරම්භ නොකරන ලෙස උපදෙස් දී තිබුණද යම් ව්‍යාපෘතියක් ඉටු නොකිරීම මත ජනතාව පීඩාවට පත්වීමක් සිදුවන්නේ නම් එවන් යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පවසා සිටි අතර එය කමිටුවේ සියළු සාමාජිකයින්ගේ එකඟත්වය මත නිර්දේශ කරන ලදී.ඒ අනුව සභිකයින් විසින් ඉදිරිපත් කර ඇති යෝජනා අතරින් ජනතාව පීඩාවට පත්වන යෝජනා යම් සාධාරණීකරණයක් සහිතව පෙන්වා දී එම යෝජනා ක්‍රියාත්මක කිරීම කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර 2022.08.24 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටු නිර්දේශ,අනුමත කිරීමට තීරණය විය.

(ඊ.1.12.6) 2022.08.24 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු නිර්දේශ පිළිගැනීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය

ඒ අනුව අදාළ නිර්දේශ ඇතුළත් 2022.08.24 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන වාර්තාව පහත පරිදි වේ.

පාණදුර නගර සභාව

මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු රැස්වීම් වාර්තාව

දිනය :2022.08.24

වේලාව : ප.ව.12.00

ස්ථානය :පාණදුර නගර සභා කමිටු රැස්වීම් ශාලාව

කමිටු සාමාජිකයන්

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
01	ගරු සභාපති	එම්.ඩී.නන්දන ගුණතිලක මහතා	ඇත
02	ගරු නාගරික මන්ත්‍රී	රජීව සංජය වීරමන් මහතා	ඇත
03	ගරු නාගරික මන්ත්‍රී	ජානක සොයිසා වික්‍රමසිංහ මහතා	ඇත
04	ගරු නාගරික මන්ත්‍රී	විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා	ඇත
05	ගරු නාගරික මන්ත්‍රී	කේ.ඩී.අශෝකා රත්නමාලි මිය	ඇත
06	ගරු නාගරික මන්ත්‍රී	කුමුදු ප්‍රනාන්දු මහතා	ඇත
07	ගරු නාගරික මන්ත්‍රී	ලලීන් හසන්ත රුදිගෝ මහතා	ඇත
08	ගරු නාගරික මන්ත්‍රී	පද්මා කොස්තා මිය	නැත
09	ගරු නාගරික මන්ත්‍රී	ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය	ඇත

සහභාගී වූ වෙනත් නිලධාරී

අනු අංකය	තනතුර	නම	පැමිණීම ඇත/නැත
01	ලේකම්	ටී.මානෙල් සියඹලාගොඩ මෙය	ඇත
02	ගණකාධිකාරී	තිලක් මුණසිංහ මහතා	ඇත
03	වැඩ අධිකාරී	කේ.පී.මායාරත්න මහතා	ඇත
04	අංශ ප්‍රධානී (කර්මාන්ත)	තමිලා විජයසිංහ මිය	ඇත

01. කර්මාන්ත අංශය

1.1 PUC/05/03/02-01/2022 ලිපිගොනුවට අනුව 2022.08.05 වන දින පාණදුර නගර සභාවට අයත් වාහන සඳහා ඩීසල් ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත ගෙවිය යුතු රු 221,320.00 ක මුදල එම ආයතනයට ගෙවීම සඳහා මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 221,320.00 ක මුදල ,එච්.ඩී.පීරිස් සහ සමාගම වෙත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

02. සාකච්ඡා කරන ලද වෙනත් කරුණු

2022.08.24 වන දින කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටුවෙන් නිර්දේශ වී මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලද කරුණු

2.1 PUC/5/4/2/5/2022 මිනුවන්පිටිය සුසාන භූමිය වටා තාප්පය ඉදිකිරීම ලිපිගොනුවට අනුව මෙම කර්මාන්තය පළාත් සභා ව්‍යාපෘති යෝජනාවක් ලෙස ඉදිරිපත් වී ඇති යෝජනාවකි.පැවති මිල ගණන් ඉහල යාම මත ව්‍යාපෘතියේ වැඩ එක් කොටසක් පමණක් ඉටු කර ඇති අතර එම කොටස සතුටුදායක තත්ත්වයේ පවතී.ඉතිරි වැඩ කොටස නිම කළ නොහැකි බව කොන්ත්‍රාත්කරු වාචිකව දැනුවත් කර ඇත.අවසාන බිල්පතෙහි සම්පූර්ණ මුදල රු 775,572.18 ක් වේ.එම මුදලින් රු 77,557.22 ක් වූ 10% අතරඳවුම් මුදල අඩුකර රු 698,014.96 ක මුදල, ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීමත්, අවසාන බිල්පතෙහි සම්පූර්ණ මුදල වන රු 775,572.18 ක මුදල පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ගෙන්වා ගැනීමත් කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 698,014.96 ක මුදල, ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීමත්, අවසාන බිල්පතෙහි සම්පූර්ණ මුදල වන රු 775,572.18 ක මුදල පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ගෙන්වා ගැනීමත් මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.2 PUC/05/03/01-04/2020 ලිපිගොනුවට අනුව LK-0776 අංක දරණ ටිපර් රථය සඳහා රක්ෂණ බලපත්‍රය ලබාගැනීම වෙනුවෙන් , Sri Lanka Insurance ආයතනය වෙත ගෙවිය යුතු රු 11,009.51 ක මුදල ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 11,009.51 ක මුදල, Sri Lanka Insurance ආයතනය වෙත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.3 PUC/5/4/1/16/2022 ශ්‍රී මහා විහාර පාර,නිමල්කා උද්‍යාන පාරෙහි බෝක්කුව ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකසන ලද රු 425,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 425,000.00 ක ඇස්තමේන්තුව,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.4 PUC/5/4/1/16/2022 ශ්‍රී මහා විහාර පාරේ අතුරු පාරෙහි බෝක්කුව ඉදිකිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකසන ලද රු 275,000.00 ක ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 275,000.00 ක ඇස්තමේන්තුව,මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.5 PUC/5/4/1/13-2022 ඉන්ධන ටැංකිය බහාලීම සඳහා කොන්ක්‍රීට් ටැංකියක් ඉදිකිරීම ලිපිගොනුවට අනුව එම ව්‍යාපෘතියේ කොටස් ගෙවීමක් වන රු 923,519.26 ක මුදල ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීම කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 923,519.26 ක මුදල, ඉන්ද්‍රජෝති මාවත සුභ සාධක සමිතිය වෙත ගෙවීම මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

2.6 PUC/5/4/3/35/2020 ප්‍රධාන පුස්තකාලයේ වැසිකිළිය සකස් කිරීම ලිපිගොනුවට අනුව එකී ව්‍යාපෘතිය ඉටු කිරීම වෙනුවෙන් සකසන ලද රු 2,354,314.03 ක සංශෝධිත ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුව නිර්දේශ කර මුදල් කමිටු නිර්දේශයට ඉදිරිපත් කරන ලදී.

රු 2,354,314.03 ක සංශෝධිත ඇස්තමේන්තුව මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර2022.08.24 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු නිර්දේශ,අනුමත කිරීමට තීරණය විය.

(ඊ.2) ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා ඉදිරිපත් කරන ලද යෝජනා

(ඊ.2.1)පාණදුර ජයතිලක මාවතේ ඉහළ කොටසේ දෙපස කාණු පද්ධතිය විවෘතව තිබීම නිසා අනතුරු සිදුව ඇත.එමනිසා එහි එක් පසෙකට කොන්ක්‍රීට් ලෑලි දමා සංවර්ධනය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී පුෂ්පා ෆොන්සේකා මිය

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

හොරණ පාරේ ඩිපෝ එක ඉදිරිපිට ඇති පාර මාරුවීමේ කහඉර අවසන් වන ස්ථානයේ,කාණුව මත දමා ඇති කොන්ක්‍රීට් ස්ලැබ් කැල්ල කැඩී ඇති අතර එම ස්ථානයෙන් පාසල් ළමුන් ඇතුළු විශාල පිරිසක් පාර මාරුවන බැවින් යම් අනතුරක් සිදුවිය හැකියි.එමනිසා එම ස්ථානයටද කොන්ක්‍රීට් ස්ලැබ් කැල්ලක් කඩිනමින් දැමිය යුතු බව පවසා සිටින ලදී.

<u>ගරුසභාපතිතුමා</u>

කුරුණෑගල සිදුවූ අවාසනාවන්ත සිදුවීම ද පූර්වා දර්ශයක් ලෙස සිතමින් කාණු අයිති වන්නේ සභාවටද මාර්ග සංවර්ධන අධිකාරියටද නාගරික සංවර්ධන අධිකාරියටද යන්න නොසිතා ජනතාවට වියහැකි ආපදාව සලකමින් කොන්ක්‍රීට් ස්ලැබ් දැමිය යුතු කාණු හඳුනා ගෙන ඒවා පිළිසකර කිරීමට කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතරපාණදුර ජයතිලක මාවතේ ඉහළ කොටසේ දෙපස කාණු පද්ධතිය විවෘතව තිබීම නිසා අනතුරු සිදුවිය හැකි බැවින් එහි එක් පසෙකට කොන්ක්‍රීට් ලෑලි දමා සංවර්ධනය කිරීමට තීරණය විය.

(ඊ.2.2) එම මාර්ගයේ (පාණදුර ජයතිලක මාවතේ) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට අයත් කණුව ගලවා පිටු පසට ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.(මක්නිසාද එමගින් මාර්ගය අවහිර වී ඇත)

යෝජනා ස්ථිරත්වය : ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතරපාණදුර ජයතිලක මාවතේ ඇති ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට අයත් කණුව මඟින් මාර්ගය අවහිර වී ඇති බැවින් එම කණුව ගලවා පිටුපසින් ස්ථාපිත කිරීමට තීරණය විය.

(ඊ.3) ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා ඉදිරිපත් කරන ලද යෝජනා

(ඊ.3.1) පාණදුර,නල්ලූරුව,බෝධිරුක්ඛාරාම පාර,ජයබෝධි විහාරය ඉදිරිපිට කාණුව නිරාවරණය වී තිබීම නිසා කිහිපවිටක් විවිධ අනතුරු සිදුවී තිබේ.එම නිසා එම කාණුවේ එම අනතුරුදායක කොටසට කොන්ක්‍රීට් ස්ලැබ් අතුරා දෙන ලෙස මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී පුෂ්පා ෆොන්සේකා මිය

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතර පාණදුර, නල්ලූරුව, බෝධිරුක්ඛාරාම පාර, ජයබෝධි විහාරය ඉදිරිපිට කාණුව නිරාවරණය වී තිබීම නිසා අනතුරු සිදුවිය හැකි බැවින් එම කාණුවේ එම අනතුරුදායක කොටසට කොන්ක්‍රීට් ස්ලැබ් ඇතිරීමට තීරණය විය.

(ඊ.4) ගරු නාගරික මන්ත්‍රී ආර්.ඒ.හර්ෂා මිහිරාණි මිය ඉදිරිපත් කරන ලද යෝජනා

(ඊ.4.1) පාණදුර නගරයේ ජන උරුමය සංවිධානය මඟින් පාණදුර මිනුවම්පිටිය පොදු සුසාන භූමියේ බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිමාවක් තැන්පත් කිරීම සඳහා ඉල්ලීම් කර ඇති අතර එම ඉල්ලීමද සලකා බලමින් මිනුවම්පිටිය සුසාන භූමියේ සුදුසු ස්ථානයක බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිමාව ස්ථාපිත කිරීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී කේ.ඩී.අශෝකා රත්නමාලි මිය

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා</u>

මෙම ජනඋරුමය සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති ලිපියේ සඳහන් වන පරිදි එම සංවිධානයේ සභාපති ලෙස සඳහන් කර ඇත්තේ ගරු සභාපතිතුමාගේ නම.ඒ අනුව මෙම යෝජනාව ගරු සභාපතිතුමාට ඉදිරිපත් කිරීමට තිබූ බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ.පීරිස් මහතා</u>

ගල්කිස්ස ,දෙහිවල වැනි අනෙකුත් සුසාන භූමිවල පොදුවේ සියළු ආගමිකයින්ට තම ආගමික කටයුතු කිරීමට හැකි වන පරිදි ඉඩසකස් කර තිබෙනවා එකම ශාලාවක.එමනිසා හැකියාවක් තිබෙනවා නම් මේවන විට අළුත්වැඩියා කිරීමට ඇති ගොඩනැගිල්ලේ ශාලාව ,සියළු ආගමිකයින්ට සරිලන ආකාරයෙන් සකස් කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ලලීන් හසන්ත රුදිගෝමහතා</u>

මෙහිදී බුදු පිළිමය ස්ථාපිත කරන්නේ නම් පිළිමය නොතෙමෙන ලෙස ආවරණයක්ද සකස් කළ යුතු අතර මෙහි ඉදිකිරීමෙන් පසු නඩත්තු කරගෙන යාම සම්බන්ධයෙන්ද සලකා බැලිය යුතු බව පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමා

මෙය ඉතාමත් සංවේදී කරුණක්.මෙම සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද ලිපියේ මගේ නම සඳහන් වුවද වසර 04 ක කාලයක සිට මේ සංවිධානය සමඟ මාගේ කිසිදු සම්බන්ධතාවයක් නොමැත.එමනිසා එම ලිපිශීර්ෂය සංශෝධනය කරන ලෙස අදාළ සංවිධානය දැනුවත් කළ යුතු බව පවසා සිටින ලදී.මේ අවස්ථාවේ බුදු පිළිමයක් ස්ථාපිත කිරීමට යෝජනාවක් ඉදිරිපත් වන්නේම මෙම සුසාන භූමියේ මේවන විට කතෝලික ආගමිකයින්ගේ කොටසෙහි යම් ඉදිකිරීමක් පවතින බැවින්.කෙසේ හෝ මෙම ප්‍රතිමාව ස්ථාපිත කිරීමට යෝජිත වේදිකාවේ සැලැස්මත් සමඟ කර්මාන්ත කමිටුව ඉදිරිපත් කර එහිදී සාකච්ඡා කර ඉන්පසු සුසාන භූමියේ ස්ථාපති කරන ස්ථානය පිළිබඳව තීරණයකට ඒම සුදුසු බව පවසා සිටින ලදී.

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව ,ප්‍රතිමාව ස්ථාපිත කිරීම සඳහා වහලක් සහිත වේදිකාවක්ද ඉදිකිරීම සඳහා වූ සැලැස්මද සමඟ කර්මාන්ත කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ස්ථානය පිළිබඳ වූ තීරණයන් වෙත එළඹීම සුදුසු බැවින්, සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව කල්තබන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 2209/38 හා 2021.01.06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද පාණුදුර නගර සභා රැස්වීම් කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 19.8 වගන්තිය අනුව ඉදිරිපත් කරන ලද යෝජනා.

(ඊ.5) ගරු සභාපති නන්දන ගුණතිලක මැතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනා

(ඊ.5.1)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019.12.24 වැනි දිනැති අංක 2155/7 අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු රීති හී අංක 26 වගන්තියේ කාරක සභාවක් යන්න සම්පූර්ණ කිරීම සඳහා, 2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීමට සියළු සභිකයින්ගෙන් සැදුම්ලත් ඒකාබද්ධ කාරක සභාවක් රැස්කිරීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටින ලදී.

යෝජනා ස්ථිරත්වය : ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා

සභා සම්මුතිය :විරෝධතා ඇත්දැයි ගරු සභාපතිතුමා සභාවෙන් විමසීමෙන් අනතුරුව සියළු සභික මහත්ම මහත්මීන්ගේ එකඟත්වයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ අතරශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019.12.24 වැනි දිනැති අංක 2155/7 අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු රීති හී අංක 26 වගන්තියේ කාරක සභාවක් යන්න සම්පූර්ණ කිරීම සඳහා, 2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීමට සියළු සභිකයින්ගෙන් සැදුම්ලත් ඒකාබද්ධ කාරක සභාවක් රැස්කිරීමටතීරණය විය.

(උ) කාරක සභා වාර්තා පිළිබඳ සමාලෝචනය කිරීම -

(උ.1) 2022.08.02 මහජන පෙත්සම් කාරක සභා වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(උ.2)2022.08.12 දිනැති පරිසර, සෞඛ්‍ය හා ආපදා කළමනාකරණ කමිටුවාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

ජනප්‍රිය මාවතේ කාණු සම්බන්ධයෙන් සෞඛ්‍ය කමිටුවේදී සාකච්ඡා වූ අතර එම කාණු කසල මඟින් අවහිරවී තිබෙනවා.මේවා පිරිසිදු නොකිරීම හේතුවෙන් ආදායම් පරීක්ෂක මහතුන් හට එම වෙළඳුන් විසින් ගාස්තු නොගෙවා සිටීමක්ද ආදායම් පරීක්ෂක මහතුන් විසින් සභාව වෙත වාර්තා කර තිබෙනවා.එමනිසා එම කාණු පිරිසිදු කිරීමට කටයුතු කළ යුතු බව පවසා සිටින ලදී.

(උ.3) 2022.08.12දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටුවාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

අදහස් ප්‍රකාශ කරමින්:

<u>ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා</u>

ගියවර කර්මාන්ත කමිටුවේදී ඩීසල් ටැංකිය භූගතව ස්ථාපිත කිරීම සඳහා සිදුකළ යුතු ඉදිකිරීම් සඳහා අදාළ වන ඇස්තමේන්තු සම්මත කිරීමට කටයුතු කළා.එබැවින් එහි වර්තමාන තත්ත්වය පිළිබඳ යම් පැහැදිලි කිරීමක් ලබාදිය හැකි නම් සුදුසු බව පවසා සිටින ලදී.

ප.ව.12.40 - ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා විසින් ගරු සභාව , කාරක සභා අවස්ථාවට පත්විය යුතු බවට යෝජනා කළ අතර ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව,කාරක සභා අවස්ථාවට පත්වන ලදී.

ප.ව. 12.50 - ගරු නාගරික මන්ත්‍රී අශෝකා රත්නමාලි මිය විසින් කාරක සභාව ,ගරු සභා අවස්ථාවට පත්විය යුතු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව,ගරු සභා අවස්ථාවට පත්වන ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

වැඩ අධිකාරීතුමාගේ පැහැදිලි කිරීම අනුව ඉන්ධන ටැංකියේ සැපයුම්කරු විසින් සූදානම් කර තිබෙන්නේ අපගේ අවශ්‍යතාවය අනුව භූගත ටැංකියක් නොවෙයි.කෙසේ හෝ සැපයුම්කරු විසින් දැනට ලබාදීමට නියමිතව තිබූ ටැංකිය භූගත ටැංකියක් ලෙස පරිවර්තනය කර ලබාදෙන්නම් යැයි පවසා සිටිනවා.නමුදු මේ පරිවර්තනය කිරීමෙන් පසු එම වෙනස් කිරීම හේතුවෙන් අනාගතයේදී ටැංකියෙන් යම් කිසි ඉන්ධන කාන්දුවක සිදුවිය හැකි බැවින් මෙම වෙනස් කිරීම ටැංකිය පවතින ස්ථානයට ගොස් නිරීක්ෂණය කිරීම සුදුසු බවත් අදාළ පරිවර්තනය කිරීමට පෙර හා පසු අදාළ ටැංකියේ ඡායාරූප ලබාගනිමින් සභාව වෙත ලබාදීමට කටයුතු කරන ලෙස සැපයුම්කරුට දන්වා සිටින ලෙසත් පවසා සිටින ලදී.

<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

එම භූගත ටැංකිය ස්ථාපිත කිරීමට වැඩ අංගනයේ නිම කර ඇති ස්ථානයේ වර්ෂා අවස්ථා වලදී ජලයෙන් පිරී යන අතර එමඟින් ඩෙංගු මදුරුවන් බෝවීමට හැකියි.එමනිසා ජලය නොරැඳෙන ලෙස අදාල ස්ථානයේ ඉහළින් තාවකාලික ආවරණයක් යොදමින් වසා දැමීම සුදුසු බව පවසා සිටින ලදී.

(උ.4) 2022.08.18 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(උ.5) 2022.08.24 දිනැති කර්මාන්ත හා දේපළ සංරක්ෂණ කමිටුවාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(උ.6) 2022.08.24 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටු වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ) සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය කිරීම -

(ඌ.1) 2022 ජූලි මස ලැබීම් ගෙවීම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ.2) 2022 ජූලි මස වරිපනම් අයකිරීම සම්බන්ධ මාසික ප්‍රගති වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඌ.3) 2022.07.31 දිනට හිඟ ආදායම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ) අංශ ප්‍රගතිය සලකා බැලීම -

(එ.1) 2022 ජූලි මස ආදාහනාගාරයේ ආදායම් වියදම් වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.2) 2022.06.01 සිට 2022.06.30 දක්වාසභාව විසින් කසළ කළමනාකරණයේදී ,කසළ අවසන් බැහැර කිරීම පිළිබඳ වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.3) 2022.07.01 සිට 2022.07.31 දක්වාසභාව විසින් කසළ කළමනාකරණයේදී ,කසළ අවසන් බැහැර කිරීම පිළිබඳ වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.4) 2022අගෝස්තු මාසයේ ඩෙංගු මර්දන ව්‍යාපෘති සේවකයින්, සේවයේ යෙද වූ ආකාරය පිළිබඳ වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.5) බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමියගේ උපදෙස් පරිදි 2020.02.10 වන දින බඳවා ගන්නා ලද ඩෙංගු මර්දන ව්‍යාපෘති සේවකයින් 2022අගෝස්තු මාසයේ සේවයේ යෙද වූ ආකාරය පිළිබඳ වාර්තාව

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.6) 2022 ජූලි මස නගර සභා නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

(එ.7) 2022 ජූලිමස පෙර පාසල් මාසික ප්‍රගතිය

ගරු සභාවේ අවධානය යොමු විය.

(ඒ) වෙනත් කරුණු

(ඒ.1) <u>ගරු නාගරික මන්ත්‍රී එච්.චන්දිම ඒ. පීරිස් මහතා</u>

(එ.1.1) පසුගිය දින උපන්දිනය සැමරූ ගරු සභාපතිතුමාට සුභ උපන්දිනයක් ලෙස සුභ පතන අතරම දීර්ඝායුෂ හා එතුමාගේ සියළු කටයුතු සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරන බව පවසා සිටින ලදී.

(ඒ.1.2)පසුගිය දිනක ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතාගේ ආදරණීය බිරිඳගේ වියෝවීම සැලවූ මොහොතේ මා සිතුවෙ එය කාගේ හෝ කැත විහිළුවක් ලෙසයි.ඒ අවස්ථාවේ මුලින්ම කුමුදු මන්ත්‍රීතුමා වෙත දුරකථනය ඔස්සේ සම්බන්ධවී පුවත සම්බන්ධයෙන් විමසූ අතර එහිදී එතුමා හැඩූ කඳුළින් එය සත්‍යයක් බව පවසා සිටියා.මෙය ඉතාමත් දුක්මුසු සිදුවීමක්.ස්වාමිපුරුෂයෙකුට තම බිරිඳ තමයි ජීවිතයේ හයියක් ලෙස සිටින්නේ.නමුදු මෙහිදී ඉන් එහාට ගොස් කුමුදු මන්ත්‍රීතුමාගේ සියළු දේශපාලන කටයුතු වලටත් දෙමාපියන් බලාගනිමින් මෙන්ම සියළු කටයුතු වලදී හයියක් වන්නේත් එතුමාගේ බිරිඳ. මෙම අහිමි වීම පුතාට මෙන්ම එතුමාට ලොකු පාඩුවක්.නමුදු කවදා හෝ අපට මෙලොව හැර යෑමට සිදුවෙනවා.එමනිසා මේ අවස්ථාවේ මගෙත් ,අප පක්ෂයේත් අප සියළු දෙනාගේත් ශෝකය එතුමා වෙත පළකරන බව පවසා සිටින ලදී.

(ඒ.1.3) සභාවේ විදුලි අංශයේ සේවය කරන කුසුම්සිරි මහතා ,දැන් මෙම අංශයේ වැඩ කළද ඔහු පෙර රියදුරු තනතුරේ සිටින ලදී.එම තනතුරේ සිටියානම් ඔහු මේ වන විට පළමු ශ්‍රේණියේ පිහිටමින් විශ්‍රාම ගත වීමට තිබුණා.එතුමාගෙන් ලොකු සේවයක් මේ සභාවට මෙන්ම මෙම පාණදුර නගරයට සිදුවී තිබෙනවා.ඔහුගේ තනතුරෙහි පවත්නාවූ ගැටළුව සම්බන්ධයෙන් සභාව යම් පියවරයන් කිහිපයක් ගෙන තිබෙනවා.නමුදු මෙම සභාවාරය අවසන් වීමට ඇත්තේ තවත්කෙටි කාලයක් බැවින් කුසුම්සිරි මහතාගේ එම වැඩ කටයුතු කඩිනම් කර මෙම සභාව පවතින කාලයේදීම ඔහුව අදාළ ශ්‍රේණියන්හී පිහිටුවා තැබිය හැකි උපරිම තලයේ පිහිටුවා විශ්‍රාම ලබාදීම වඩාත් සුදුසුයි. එම නිසා ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාගේ යම් මැදිහත් වීමක් සිදු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.2) <u>**ගරු නාගරික මන්ත්‍රී එම්.පද්මසිරි සිල්වා මහතා**</u>

(ඒ.2.1) ගරු සභාපතිතුමාගේත් ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතාගේත් ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී මියගේත් උපන් දිනයන් පැවති අතර එම සියළු දෙනාට සුභ උපන් දිනයක් හා සියළු කටයුතු සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

(ඒ.2.2) කුමුදු මන්ත්‍රීතුමාගේ බිරිඳ වන චන්ද්‍රිකා මහත්මියගේ වියෝව සම්බන්ධයෙන් තමාගේ ශෝකය මේ අවස්ථාවේ පුද කරන බව පවසා සිටින ලදී.

(ඒ.2.3) අද උදෑසන මා අතට පෙත්සමක් ලැබුණු අතර ඒ සම්බන්ධයෙන් යම් අසාධාරණයක් වූවා යැයි පවසමින් අදාළ පාර්ශවය විසින් දුක්ගැනවිල්ලක්ද ඉදිරිපත් කර සිටියා.අද දින විජිත් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද්දේද එම පෙත්සම වන අතර මේ පිළිබඳව සොයා බැලීමේදී මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා මහතාට ලබාදී තිබෙනවා යන්න දැනගැනීමට ලැබුණා.එමනිසා ඒ පිළිබඳව සොයා බලා යම් සාධාරණයක් ඉටුකර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

(ඒ.2.4) නල්ලූරුව කොට්ඨාශයේ , ගාලුපාරේ මැද කොටසේ මේවන විට විදුලි ආලෝකය ක්‍රියාවිරහිත වී තිබෙනවා.එමනිසා මේ සඳහා යම් ක්‍රියාමාර්ගයක් ගතහැකි නම් එම පියවරයන් වෙත කඩිනමින් යොමුවී අදාළ ආලෝකය ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

(ඒ.2.5) බෝධිරුක්ඛාරාම පාරේ මෙන්ම ජයන්ති මාවතේ ද වලවල් සෑදී ඇති බැවින් එම වලවල් වැසීමට ද කටයුතු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

(ඒ.2.6) ඕබට් සිල්වා මාවතේ පැරණි කියවීම් ශාලාව අළුත්වැඩියා කිරීමට වහල ගලවා ඇති අතර එහි වැඩ කටයුතු මේවන විට නතරවී ඇත.වර්ෂාවට මෙම බිත්ති තෙමී කඩා වැටීමට ලක්විය හැකි බැවින් එම වැඩකටයුතු නැවත ආරම්භ කර අවසන් කරන ලෙසත් කොවිඩ් තත්ත්වය මත වසා දැමූ ඕබට් සිල්වා කියවීම් ශාලාව නැවත විවෘත කිරීමට කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

(ඒ.3)<u>ගරු උපසභාපති පී.එච්.විල්මන් මහතා</u>

(ඒ.3.1) නැව්රෝ බීච් හෝටලය පිටුපස බෝක්කුව අසල කන්ඩියක් ඇති බැවින් එමගින් යම් අනතුරක් සිදුවිය හැකියි. මාගේ බිරිඳද අනතුරට පත්වූ බැවින් මෙම ස්ථානය කඩිනමින් සකස් කර දෙනමෙන්ඉල්ලාසිටිනලදී.

(ඒ.3.2) වෙරළෙහි ඉඩම වටා කම්බි ගසා පිරිසිදු කර රථවාහන නැවතීම සඳහා භාවිතා කළ හැකි නම් එමඟින් විශාල ආදායමක් සභාව වෙත ලබාගත හැකි බැවින් ඒ සඳහා අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.3.3) සාගර මාවතේ අවුරුදු 50 ක් පමණ ඉතිහාසයක් ඇති සභාව සතු ඉඩමක් වෙනත් පුද්ගලයෙක් විසින් ඔප්පු සකසා ගෙන අයිතිකර ගෙන තිබෙනවා.එමනිසා මෙම ඉඩම සම්බන්ධයෙන් සභාව මැදිහත් වී නීති මාර්ගයෙන් කටයුතු කර එය සභාවට පවරා ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.4) <u>ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී ද සිල්වා මිය</u>

(ඒ.4.1) කුමුදු මන්ත්‍රීතුමාගේ බිරිඳගේ අභාවය පිළිබඳව කණගාටුව පළ කරන බව පවසා සිටින ලදී.

(ඒ.4.2) මගේ කොට්ඨාශයේ ඇති වැඩ කටයුතු කිහිපයක්ම ඉටුකර දෙන මෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක සම්පත් මහතාටත් ගරු සභාපතිතුමාටත් සභා වාරයන් කිහිපයක සිට පවසා සිටියද ඒ කිසිදු කටයුත්තක් මේවන තෙක් ඉටුකර නොදීම සම්බන්ධයෙන් ඉතාමත් කණගාටු වන බව පවසා සිටින ලදී.

(ඒ.5) <u>ගරු නාගරික මන්ත්‍රී කේ.ඩී.අශෝකා රත්නමාලි මිය</u>

(ඒ.5.1) පසුගිය දිනයන්හිදී උපන්දිනය සැමරූ ගරු සභාපතිතුමාටත් ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතාටත් ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී මියටත් දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරන ලදී.

(ඒ.5.2) කුමුදු මන්ත්‍රීතුමාගේ බිරිඳගේ වියෝව සම්බන්ධයෙන් ඉතාමත් කණගාටු වෙනවා.හැමදාම උදේට දුරකථනයෙන් එතුමියත් එක්ක මා කතා කරනවා.ඇය සමඟ ඉතාමත් සුහදත්වයකින් කටයුතු කළා.එමනිසා මෙම වියෝව දරාගත නොහැකි දුකක් බව පවසා සිටින ලදී.

(ඒ.6) <u>ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතා</u>

(ඒ.6.1) ගරු සභාපතිතුමාටත් ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතාටත් ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී මියටත් නිදුක් නිරෝගී වාසනාවන්ත සුභ උපන්දිනයක් ප්‍රාර්ථනා කරන බව පවසා සිටින ලදී.

(ඒ.6.2) කුමුදු මන්ත්‍රීතුමාගේ ආදරණීය බිරිඳ ,නොසිතූ අවස්ථාවක අකල් මරණයකින් අප අතරින් සමුගැනීම අපට ඉතාමත් කණගාටුදායක අවස්ථාවක්.කුමුදු මන්ත්‍රීතුමාගේ නිවසට යන සෑම අවස්ථාවකම එතුමිය අපව ඉතාමත් සුහදව පිළිගන්නා අතර ආගන්තුක සත්කාරද කරනු ලබනවා.එතුමියට නිවන් සැප ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

(ඒ.7) <u>ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා</u>

(ඒ.7.1) ගරු සභාපතිතුමාටත් ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතාටත් ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී මියටත් උපන්දිනය වෙනුවෙන් සුභ පැතුම් එක්කරන බව පවසා සිටින ලදී.

(ඒ.7.2) කුමුදු මන්ත්‍රීතුමාගේ ආදරණීය බිරිඳගේ වියෝවය පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන අතරම එතුමිය වගේ දිරිය කාන්තාවන් නැවත අප අතරම ඉපදේවයි කියා ප්‍රාර්ථනා කරන බව පවසා සිටින ලදී.

(ඒ.7.3) අවුරුදු 04 1/2 මෙම සභාවේ සභිකයෙකු ලෙසත් පෙර සභා වාරයකදීද සභිකයෙකු ලෙස සිට ඇති අතර එම සභා කාලය තුළ මා කිසිදු කුණු කතාවක් හෝ කුණුහරුපයක් කියා නැහැ.ඒ තත්ත්වය මා ඉදිරියටත් පවත්වාගෙන යාමට උත්සහ කරනවා.කවුරුන් හෝ අපගේ අදහස් දැක්වීම් කුණු කතා හෝ කුණුහරුපය ලෙස සිතනවානම් එය එසේ නෙමෙයි. අපි මේ කරන්නේ අපව පත්කර එවන ලද ජනතාවගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටීමක් බව පවසා සිටින ලදී.

(ඒ.7.4) වැකඩ ජනජය නිවාසලාභීන්ට ඔප්පු ලබාදීම මේ සභා කාලය අවසන් වීමට මත්තෙන් ඉටු කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ මැදිහත් වීමක් සිදුකරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.7.5) වැකඩ කියවීම් ශාලාවේ සිවිලිම ගැසීමේ කටයුතු අදාළ කොන්ත්‍රාත්කරු විසින් පවතින්නාවූ මිල ගණන් වල ඉහළයාම මත ඉටු කල නොහැකි බව දන්වා සිටිනවා නම් සභාව ගත් තීරණයට අනුව අදාළ කටයුත්තට අවශ්‍ය භාණ්ඩ ,සභාව විසින් සපයා දෙමින් හෝ එම කාර්යය ඉටු කිරීමට කටයුතු කරන ලෙසත් විදුලිය ලබාදීමේ කටයුතු මේවන විට සිදුකර ඇති බැවින් අවශ්‍ය ලීබඩු ලබාදෙමින් මෙය පුස්තකාලයක් ලෙස ආරම්භ කිරීමට කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

(ඒ.7.6) වැකඩක්‍රීඩා පිට්ටනියේ තිබූ ඒබීසී සේදී ගොස් මේවන විට ගල් කැලි පමණක් රැදී තිබෙනවා. එමනිසා දරුවන්ට ක්‍රීඩා කිරීමට නොහැකි වී තිබෙනවා.මෙම ගල් යම් ප්‍රයෝජනයකට ගත හැකි බැවින් ඒවා සභා මඟින් ඉවත් කර භාවිතයට ගැනීම සුදුසු බව පවසා සිටින ලදී.

(ඒ.7.7) නගර ශාලාවේ ප්‍රධාන ගේට්ටුව අළුත්වැඩියා කලයුතු බැවින් එම ගේට්ටුව අළුත්වැඩියා කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.7.8) සුමනධීර මාවත ඉඩම වටා කම්බි මේවන විට ගසා ඇති අතර එම ඉඩමේ ඉටු කිරීමට යෝජිත කාර්යය ආරම්භ කරන ලෙසත් එම අවට පරිසරය අනුව ඒ ස්ථානයට මුරකරුවකු යෙදවීම සුදුසු බවත් පවසා සිටින ලදී.

(ඒ.7.9) පිහිණුම් තටාකය සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවති අතර එහිදී පිහිණුම් තටාකය සම්බන්ධයෙන් අඩුපාඩු රාශියක් ඉදිරිපත් වුණා.එම අඩුපාඩු සම්පූර්ණ කරන අතරේම එහි සිටින පුහුණුකරුවන් සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට අවස්ථාවක් සලසා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.7.10) වැකඩ පෙර පාසලේ ඉහළ මහලට යෑමට තිබෙන පඩිපෙළ මේවන විට දිරා ඇති බව පෙර පාසලේ ගුරුතුමිය විසින් දන්වන ලද අතර එය කඩා වැටී යම් අනතුරක් සිදුවීමට පෙර සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන ලදී.

(ඒ.7.11) මිනුවම්පිටිය සුසාන භූමියේ ඇති පැරණි ගොඩනැගිල්ල කඩා වැටීමට පෙර යම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස පවසා සිටින ලදී.

(ඒ.7.12) වරිපනම් බදු සංශෝධන මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන අතර එහිදි වරිපනම් සංශෝධනය කරන දේපළහී හිඟ වරිපනම් ඇත්නම් එම හිඟ මුදල් අයකිරීම පිළිබඳ වාර්තාවක් සභාව විසින් ඉල්ලා සිටියද එය එක් වරක් පමණක් ඉදිරිපත් වුණා.එමනිසා එම වාර්තාව සභාව වෙත ලැබීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.7.13) හඩිසන් උද්‍යානයේ ඇති ක්‍රීඩා උපකරණයක් මේවන විට කැඩී ඇති අතර එය නූලක් පමණක් ගැටගසා ඇතුළු වීම වළක්වා තිබෙනවා.නමුත් එය ප්‍රමාණවත් නොවන බැවින් දරුවන්ට යම් අනතුරක් සිදු වීමට පෙර සුදුසු පියවරක් ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

(ඒ.7.14) පුස්තකාලයේ වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ඇස්තමේන්තු කර්මාන්ත කමිටුව විසින් නිර්දේශ කළ අතර ඒ අනුව එහි කටයුතු කඩිනමින් ඉටු කර අවසන් කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.7.15) සභාව විසින් සිදුකරනු ලබන නඩත්තු කටයුතු වලට අවශ්‍යය භාණ්ඩ එක් එක් කාර්යය සඳහා කුඩා ප්‍රමාණයකින් මිලදී ගැනීමකින් තොරව ගබඩාව වෙත යම් තොගයක් ලබාගනිමින් ගබඩාව හරහා නිකුත් කිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

(ඒ.8) <u>ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතා</u>

(ඒ.8.1) කුමුදු මන්ත්‍රීතුමාගේ ආදරණීය බිරිඳගේ ආභාවය සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරන අතරම ඇයට නිවන් සුව ලැබේවායි ප්‍රාර්ථනා කරන බව පවසා සිටින ලදී.

(ඒ.8.2) සංදේශ හා පෙත්සම් වාරයේදී මා විසින් ලිපියක් අද දින ඉදිරිපත් කළ අතර ඒ සම්බන්ධයෙන් මීට පෙර සභාව වෙත ලිපියක් යොමු කර ඇති බැවින් එහි ප්‍රගතිය කුමක්ද යන්න දැනගැනීම සුදුසු බව පවසා සිටින ලදී.

ප.ව.02.50 - ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් ගරු සභාව , කාරක සභා අවස්ථාවට පත්විය යුතු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ජානක සොයිසා වික්‍රමසිංහ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව,කාරක සභා අවස්ථාවට පත්වන ලදී.

ප.ව. 03.05 - ගරු නාගරික මන්ත්‍රී පියසේන ප්‍රනාන්දු මහතා විසින් කාරක සභාව ,ගරු සභා අවස්ථාවට පත්විය යුතු බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව,ගරු සභා අවස්ථාවට පත්වන ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

අදාළ ලිපිය සභාව වෙත ඉදිරිපත් වී ඇති අතර අදාළ ලිපිය ආදායම් පරීක්ෂක මහතුන්ගේ නිර්දේශය ලබාගැනීම සඳහා මා විසින් යොමුකර ඇත.දැන් ආදායම් පරීක්ෂක මහතුන් විසින් ඔවුන්ගේ නිර්දේශය යොදා මා වෙත ඉදිරිපත් කර ඇති බව පවසා සිටිනවා .අදාළ නිර්දේශය මා තවම පරීක්ෂා කිරීමක් සිදුකළේ නැහැ.නමුදු මෙහි සිදුවූ වරද නම් මෙම ලිපිය ඉදිරිපත් කළේ විජිත් මන්ත්‍රීතුමා යැයි නොදැන අදාළ ලිපියේ දිනය බලා ජානක මන්ත්‍රීතුමා වෙත මා යොමුකර එහි සත්‍යතාවය විමසා සිටීම පමණයි.අදාළ කාර්යය ඉටුවෙමින් තිබෙනවා යැයි පවසා සිටින ලදී.

(ඒ.9) <u>ගරු නාගරික මන්ත්‍රී රජීව සංජය වීරමන් මහතා</u>

(ඒ.9.1) කුමුදු මන්ත්‍රීතුමාගේ ආදාරණීය බිරිඳගේ වියෝවීම පිළිබඳ මාගේත් සියළු සහිකයින්ගේත් ශෝකය පළකරන අතර ඇය ඉතාමත් ගුණගරුක කාන්තාවක්. දරුවාගේ ඉගෙනීමේ කටයුතුද දෙමාපියන්ගේ කටයුතුද අනෙකුත් සියළු කටයුතුද බලාකියා ගත්තේ ඇයයි.එතුමිය කුමුදු මන්ත්‍රීතුමාටත් ඉතාමත් හයියක් වූ අතර ඇය ස්වාමිපුරුෂයෙකු ලෙස කුමුදු මන්ත්‍රීතුමාට ඉතාමත්

ගෞරවයකින් යුක්තව සලකනු ලබුවා.එමනිසා ඇයගේ මේ හදිසි අභාවය ඉතාමත් කණගාටුදායක අවස්ථාවක් වන අතර ඇයට නිවන් සුව ප්‍රාර්ථනා කරන බව පවසා සිටින ලදී.

(ඒ.9.2) ගරු සභාපතිතුමාටත් ගරු නාගරික මන්ත්‍රී විජිත් විශ්වනාත් ප්‍රනාන්දු මහතාටත් ගරු නාගරික මන්ත්‍රී ගයා උදයංගනී මියටත් නිදුක් නිරෝගී වාසනාවත්ත සුභ උපන්දිනයක් ප්‍රාර්ථනා කරන බව පවසා සිටින ලදී.

(ඒ.9.3) ආසන්න දිනවල ප්‍රිමික්ස් යොදමින් සිදුකළ මාර්ග නඩත්තු කිරීමේ කටයුතු කිසිදු පිළිවෙළකට සිදුකර නැහැ.ජනතාව ඒ සම්බන්ධයෙන් දැඩි අප්‍රසාදයක් අප වෙත දක්වා සිටිනවා.එමෙන්ම ශ්‍රී මහා විහාර පාරේ කාණුවක් මත අනවසර ලෙස කණුවක් ඉදිකර තිබීම පිළිබඳව සභා වාරයන් කිහිපයකදී අදහස් දක්වා සිටියද ඒ කිසිදු දෙයක් සම්බන්ධයෙන් සභාවේ මැදිහත් වීමක් සිදු නොවන බවත් ඒ පිළිබඳව ඉතාමත් කණගාටු වන බවත් පවසා සිටින ලදී.

(ඒ.9.4) සභාව වෙත ලැබෙන වාහන නැවතුම් ගාස්තු වැඩිකර ගැනීම සඳහා උසාවිය අවට භූමියේත් ආතර් වී දියෙස් මාවතේත් ජනප්‍රිය මාවතේත් ගාස්තු අයකිරීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.එමෙන්ම මේවන විට වැඩි ගාස්තු ප්‍රමාණයක් එකතු කර ලබාදෙන ලද ගුණසිරි හා ප්‍රදීප් යන සේවක මහතුන්ව අගයන්නත් මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසා සිටින ලදී.තවද වගකීම් විරහිතව කටයුතු කරන සේවකයින් සම්බන්ධයෙන් පවත්නාවූ නීතිරීති අනුව කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

(ඒ.9.5) පුස්තකාලයේ වැසිකිළි පද්ධතිය මේ අවස්ථාවේදී හෝ අළුත්වැඩියා කර අවසන් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

<u>ගරු සභාපතිතුමා</u>

පාණදුර නගරය වෙත එන ජනතාවට පොදු වැසිකිළි පහසුකම් නොමැති බැවින් නගර ශාලාවේ ඇති වැසිකිළි පද්ධතියද අළුත්වැඩියා කර ජනතාව වෙත අදාළ පහසුකම් ලබාදිය යුතු බවත් අදාළ ස්ථානයට සේවක මහතෙකු යොදවා යම් මුදලක් අයකිරීමට කටයුතු කළ යුතු බවත් පවසා සිටින ලදී.

(ඒ.10) <u>**ගරු නාගරික මන්ත්‍රී ලලීන් හසන්ත රුදිගෝ මහතා**</u>

(ඒ.10.1) ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතාගේ ආදරණීය බිරිඳගේ හදිසි අභාවය සම්බන්ධයෙන් මාගේත් සභාවේ සියළු දෙනාගේත් සංවේදය මේ අවස්ථාවේ පළකරන බව පවසා සිටින ලදී.

(ඒ.10.2) සොයිසා පාරේ ජේ ජේ හෝටලය අසළ බෝක්කුව වසර 50 ක කාලයකට පසු පිරිසිදු කිරීමට කටයුතු කළ අතර ඒ සඳහා කැපවීමෙන් වැඩ කළ සේවක මහතුන්ටත්,ගරු සභාපතිතුමාටත් වැඩ අධිකාරීතුමාටත් ස්තූතිය පුදකරන බව පවසා සිටින ලදී.

(ඒ.10.3) මිනුවම්පිටිය ආදාහනාගාරයට පැමිණෙන අයගේ ප්‍රයෝජනය සඳහා වතුර ෆිල්ටරයක් තැබීම සුදුසු වන අතර එය යම් පරිත්‍යාගයක් ලෙස හෝ ලබාගනිමින් එම ස්ථානයට ලබාදීම සුදුසු බව පවසා සිටින ලදී.

(ඒ.11) **ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතා**

(ඒ.11.1) මාගේ බිරිඳගේ හදිසි අභාවය මා කිසිසේත් බලාපොරොත්තු වූ දෙයක් නොවේ.ඇගේ රෝගී තත්ත්වය සැලවූ මොහොතේ මා නිවසට ගොස් රෝහල් ගත වීම සඳහා සුව සැරිය ගිලන් රථයක් ලබාගැනීමට උත්සහ දැරුවද එය ලබා ගැනීමට නොහැකි වුණා. ත්‍රීවීල් රථයක් මඟින් රෝහල වෙත රැගෙන ගියත් වෛද්‍යවරුන් පවසා සිටියේ රෝහල වෙත රැගෙන එන විටත් ඇය මෙලොව හැරගිහින් සිටි බවයි.ඒ අවස්ථාවේ සිට සභාව සියළුම සභිකයින් ඇතුළු සියළුම නිළධාරීන් හා සේවක මහතුන් මා සමඟ සිටි අතර එය මා හට මහත් සවියක් වූ බව පවසා සිටින ලදී.මාගේ ශක්තිය වූයේ මාගේ බිරිඳයි.ඇයට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර මතු ආත්මයන්හිදීද ඇය මාගේම බිරිඳ වී ඉපදේවායි කියා ප්‍රාර්ථනා කරන ලදී.

ගරු සභාපතිතුමා

මේ හැරයාමට අප සියළු දෙනාම කවදා හෝ මුහුණ දිය යුතු අතර ගරු නාගරික මන්ත්‍රී කුමුදු ප්‍රනාන්දු මහතාට පවසා සිටින්නේ ඔබට සහය අවශ්‍ය ඕනෑම අවස්ථාවක ඔබට සහය වීමට මෙම සභිකයින් වන සියළු දෙනාම සූදානමින් සිටින බව යැයි පවසා සිටින ලදී.

(ඒ.12) **ගරු සභාපතිතුමා**

(ඒ.12.1) පාණදුර වෙරළ තීරයේ උදේ වරුවේ පැය 02 ක් කසල එකතු කිරීම සඳහා සේවකයින් 04 දෙනෙකු ලබාගැනීමට අවස්ථාවක් ලැබී ඇති අතර එම සේවකයින්ට මසකට රු 10,000.00 ක් මුදලක් අදාළ ආයතනය විසින් ගෙවීම් කටයුතු කරනු ලැබේ.එමනිසා වෙරළ ආසන්න මේ සඳහා යෙදවිය හැකි අඩු ආදායම්ලාභී පවුලක කවුරුන් හෝ සිටිනවානම් නම් ඔවුන්ගේ නම් ලබාදෙන ලෙස පවසා සිටින ලදී.

(ඒ.12.2) ආතර් වී දියෙස් මැතිතුමාගේ මී මිනිබිරිය විවාහ වී සිටින තිලක් පතිරණ මහතා පසුගිය දිනක නගර සභා පුස්තකාලය සඳහා ප්‍රක්ෂේපන යන්ත්‍රයක්ද වටිනා පොත්පත් තොගයක්ද ලබාදුන් අතර ඒ සඳහා එතුමාට සහ එතුමාගේ පවුලේ අයට සභාවේ ස්තුතිය පුදකරන බව පවසා සිටින ලදී.

2022.09.08 වන දින මහා සභා න්‍යාය පත්‍රයට අනුව නියමිත කරුණු එපමණක් වූයෙන් අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට සහයෝගය දුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලයට තම ස්තුතිය පුද කරමින් 2022 සැප්තැම්බර් මස 08 වන දින මහා සභාවේ වැඩ කටයුතු ප.ව. 03.45 නිමාවට පත් විය.

සභාපති,
නගර සභාව,
පාණදුර.

ඇම්.ඩී. නන්දන ගුණතිලක
සභාපති
පාණදුර නගර සභාව

ලේකම්
නගර සභාව,
පාණදුර

ටී. මානෙල් සියඹලාගොඩ
ලේකම්
පාණදුර නගර සභාව

2022.09.30